# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 2024 අංක 9 දරන මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ පනත

---

**[සහතිකය සටහන් කළේ 2024 පෙබරවාරි මස 01 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2024 පෙබරවාරි මස 02 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකි ය.

**මිල :** රු. 102.00 තැපැල් ගාස්තුව **:** රු. 150.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

2024 අංක 9 දරන මාර්ගගත ක්‍රමවල
සුරක්ෂිත භාවය පිළිබඳ පනත

[සහතිකය සටහන් කළේ 2024 පෙබරවාරි මස 01 වන දින]

එල්.ඩී.-ඕ. 34/2021

**මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ කොමිෂන් සභාව පිහිටුවීම සඳහා ද; මාර්ගගතව සිදු කරනු ලබන තහනම් ප්‍රකාශවලින් ආරක්ෂාව සැලසීම සඳහා ද; තහනම් කාර්ය සඳහා මාර්ගගත ගිණුම් සහ ව්‍යාජ මාර්ගගත ගිණුම් භාවිත කිරීම වැළැක්වීම සඳහා ද; ශ්‍රී ලංකාව තුළ තහනම් කාර්ය සඳහා භාවිත කරනු ලබන මාර්ගගත ස්ථාන හඳුනාගැනීම සඳහා සහ ප්‍රකාශයට පත් කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද; තහනම් ප්‍රකාශ සන්නිවේදනය කිරීම සඳහා මුදල් සැපයීම සහ අනෙකුත් ආධාර ලබා දීම මැඩපැවැත්වීම සඳහා ද; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

**1.** මේ පනත 2024 අංක 9 දරන මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

පනත අදාළ වීම

**2.** මේ පනතේ විධිවිධාන-

(අ) ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සිටිය දී යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ වූ වරදක්, ශ්‍රී ලංකාවේ පුරවැසියකු සම්බන්ධයෙන් සිදු කරනු ලබන අවස්ථාවක දී;

(ආ) මේ පනත යටතේ වූ වරදක් සිදු කිරීම මගින්, රජයට හෝ ශ්‍රී ලංකාවේ පදිංචි තැනැත්තකුට අලාභයක්, හානියක් හෝ පීඩාවක් ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සිදු කරනු ලබන අවස්ථාවක දී;

(ඇ) මේ පනත යටතේ වූ වරදක්, කවර ස්ථානයක දී සිදු කරනු ලැබුව ද, එය ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන තැනැත්තකු විසින් සිදු කරනු ලබන අවස්ථාවක දී,

අදාළ විය යුතු ය.

පනතේ අරමුණු

**3.** මේ පනතේ අරමුණු-

(අ) මාර්ගගත ගිණුමක් මගින් හෝ මාර්ගගත ස්ථානයක් හරහා තහනම් ප්‍රකාශ සන්නිවේදනය කිරීම මගින් ඇති වන පීඩාවකින් තැනැත්තන් ආරක්ෂා කිරීම;

(ආ) මාර්ගගත ගිණුමක් මගින් හෝ මාර්ගගත ස්ථානයක් හරහා අධිකරණයට අපහාස වන්නා වූ හෝ අධිකරණයේ බලය සහ අපක්ෂපාතීත්වය පවත්වාගෙන යාමට අගතිගාමී වන්නා වූ ප්‍රකාශ සන්නිවේදනය කිරීමෙන් ආරක්ෂා වීම තහවුරු කිරීම;

(ඇ) මේ පනත යටතේ වූ වැරදි සිදු කිරීම සඳහා මාර්ගගත ගිණුම් සහ බොට් අවභාවිත කිරීම හඳුනාගැනීම, වැළැක්වීම සහ එයට එරෙහිව ආරක්ෂාව සැලසීම සඳහා වූ පියවර හඳුන්වා දීම; සහ

(ඈ) මාර්ගගත ගිණුමක් මගින් හෝ මාර්ගගත ස්ථානයක් හරහා ශ්‍රී ලංකාව තුළ තහනම් ප්‍රකාශ නැවත නැවතත් සන්නිවේදනය කරන්නා වූ මාර්ගගත ස්ථාන සඳහා මුදල් සැපයීම, එකී ස්ථාන ප්‍රවර්ධනය කිරීම සහ එම ස්ථානවලට වෙනත් ආධාර ලබා දීම වැළැක්වීම,

විය යුතු ය.

I වන කොටස

**මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ කොමිෂන් සභාව පිහිටුවීම**

මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ කොමිෂන් සභාව පිහිටුවීම

**4.** (1) (මෙහි මින් මතු "කොමිෂන් සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ කොමිෂන් සභාව යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු කොමිෂන් සභාවක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) කොමිෂන් සභාව, (1) වන උපවගන්තිය මගින් එයට පවරා ඇති නාමයෙන් අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් ඇති

සංස්ථාගත මණ්ඩලයක් විය යුතු අතර, එකී නාමයෙන් එය විසින් ද එයට එරෙහිව ද නඩු පවරනු ලැබිය හැකි ය.

(3) කොමිෂන් සභාව විසින්, මේ පනතේ අරමුණු ඉටුකර ගැනීමේ කාර්ය සඳහා, මේ පනත යටතේ කොමිෂන් සභාව වෙත පවරා ඇති බලතල සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ කිරීම, සිදු කළ යුතු ය.

කොමිෂන් සභාවේ සාමාජිකයන් පත් කිරීම

**5.** (1) තොරතුරු තාක්ෂණය, නීතිය, පාලනය, සමාජ සේවා, පුවත්පත් කලාව, විද්‍යාව සහ තාක්ෂණය හෝ කළමනාකරණය යන ක්ෂේත්‍ර එකක හෝ වැඩි ගණනක සුදුසුකම් සහ පළපුරුද්ද සහිත තැනැත්තන් අතරින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතයට යටත් ව ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් පස්දෙනෙකුගෙන් කොමිෂන් සභාව සමන්විත විය යුතු ය.

(2) 6 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, (1) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාවේ සාමාජිකයන් ලෙස පත් කරනු ලැබිය යුතු තැනැත්තන් පස්දෙනෙකුගේ නම් අනුමතය සඳහා ජනාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට නිර්දේශ කළ යුතු ය.

(3) ජනාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථා සභාවේ අනුමතය ලැබීමෙන් දින දහහතරක කාලසීමාවක් ඇතුළත, (2) වන උපවගන්තිය යටතේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් අනුමත කරන ලද තැනැත්තන් කොමිෂන් සභාවේ සාමාජිකයන් ලෙස පත් කරනු ලැබිය යුතු ය.

(4) (2) වන උපවගන්තියේ සඳහන් යම් තැනැත්තකුගේ නම අනුමත කිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් ප්‍රතික්ෂේප කරනු ලැබූ අවස්ථාවක, ජනාධිපතිවරයා විසින් අලුත් නාමයෝජනාවක් ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, ඒ අනුව එම නාමයෝජනාව සඳහා (1) වන, (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධාන අදාළ විය යුතු ය.

(5) (3) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති පරිදි දින දහහතරක කාලසීමාවක් ඇතුළත අවශ්‍ය පත් කිරීම් සිදු කිරීමට

ජනාධිපතිවරයා අපොහොසත් වන අවස්ථාවක දී, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් අනුමත කරන ලද තැනැත්තන්, ඒ කාලසීමාව ඉකුත් වන දින සිට බලපවත්වන පරිදි, කොමිෂන් සභාවේ සාමාජිකයන් ලෙස පත් කරනු ලැබූ ලෙසට සලකනු ලැබිය යුතු ය.

සාමාජිකයකු ලෙස පත් කරනු ලැබීමට නුසුදුසුකම්

**6.** යම් තැනැත්තකු -

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, පළාත් සභා මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු ලෙස තෝරා පත් කරනු ලැබ හෝ පත් කරනු ලැබ ඇත්නම්;

(ආ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නේ නම් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසියකුව සිටීම නතර වේ නම්;

(ඇ) කොමිෂන් සභාව විසින් හෝ කොමිෂන් සභාව වෙනුවෙන් ඇති කර ගන්නා ලද යම් ගිවිසුමක් යටතේ ඍජුව හෝ වක්‍රව යම් අයිතිවාසිකමක් දරනු ලබන්නේ නම් හෝ යම් ප්‍රතිලාභයක් භුක්ති විඳින්නේ නම්;

(ඈ) කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස ස්වකීය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට අහිතකර ලෙස බලපානු ලැබිය හැකි යම් මූල්‍යමය හෝ වෙනත් යම් සබඳතාවක් ඇත්නම්;

(ඉ) වලංගු හේතුවක් නොමැතිව, කොමිෂන් සභාවේ අඛණ්ඩ රැස්වීම් තුනකට පැමිණ නොමැති නම්;

(ඊ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක නීතියක් යටතේ සිහිවිකල් තැනැත්තකු බවට අනාවරණය කරනු ලැබ තිබේ නම් හෝ ප්‍රකාශයට පත් කරනු ලැබ තිබේ නම්;

(උ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක නීතියක් යටතේ බුන්වත්භාවයට හෝ වස්තුභංගත්වයට පත් තැනැත්තකු ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබ, බුන්වත්භාවයෙන් හෝ වස්තුභංගත්වයෙන් නිදහස් කර නොමැති නම්; හෝ

(ඌ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක යම් අධිකරණයක් විසින් බන්ධනාගාරගත කිරීමේ දණ්ඩනයකට යටත් කර ඇත්නම් හෝ බන්ධනාගාරගත කිරීම සඳහා ආඥාවක් නිකුත් කර ඇත්නම්,

ඒ තැනැත්තා කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස පත් කරනු ලැබීමට හෝ කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස කටයුතු කරගෙන යාමට නුසුදුස්සකු විය යුතු ය.

කොමිෂන් සභාවේ සාමාජිකයන් ධුරයෙන් ඉල්ලා අස්වීම, ඉවත් කිරීම සහ ඔවුන්ගේ ධුර කාලය

**7.** (1) තත් කාර්යය සඳහා ජනාධිපතිවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් කොමිෂන් සභාවේ සාමාජිකයකුට ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, ජනාධිපතිවරයා විසින් ඒ ඉල්ලා අස්වීම ලිඛිතව පිළිගන්නා ලද දින සිට ඒ ඉල්ලා අස්වීම බලාත්මක විය යුතු ය.

(2) කොමිෂන් සභාවේ සාමාජිකයකු-

(අ) මාස තුනකට වැඩි කාලසීමාවක් තිස්සේ පවත්නා ශාරීරික හෝ මානසික දුබලතාවක් හේතුවෙන් සිය ධුරයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට, කිරීමට සහ ඉටු කිරීමට නොහැකි වන;

(ආ) කොමිෂන් සභාවේ අනුමතය නොමැතිව අඛණ්ඩව මාස තුනකට වැඩි කාලසීමාවක් සිය ධුරයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම පැහැර හැර ඇති; හෝ

(ඇ) 6 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාර නුසුදුස්සකු වී ඇති,

අවස්ථාවක අදාළ සාමාජිකයාට කරුණු කියාපෑමට අවස්ථාවක් දීමෙන් පසුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතයට යටත්ව ජනාධිපතිවරයා විසින් ඒ තැනැත්තා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තිය යටතේ වන යම් කරුණු විභාග කිරීමක්, එම කරුණු විභාග කිරීම ආරම්භ වන දිනෙන් මාස තුනක් ඇතුළත අවසන් කරනු ලැබිය යුතු ය.

(4) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතය ලැබීමෙන් පසුව, ජනාධිපතිවරයා විසින් ලියවිල්ලක් මගින් ඒ කොමිෂන් සභාවේ සාමාජිකයා ඉවත් කරනු ලැබිය යුතු අතර, ඒ ඉවත් කිරීමේ ලිපියෙහි-

(අ) ඒ ඉවත් කිරීමේ ලිපිය ලැබුණු දිනයට පෙරාතුව වූ දිනයක් නොවන, ඒ ඉවත් කිරීම බලාත්මක විය යුතු දිනය; සහ

(ආ) ඒ ඉවත් කිරීමට හේතු,

සඳහන් කරනු ලැබිය යුතු ය.

(5) කොමිෂන් සභාවේ යම් සාමාජිකයකුගේ ධුරය (2) වන උපවගන්තිය යටතේ කරුණු විභාග කිරීම ආරම්භ කිරීමට පෙරාතුව හෝ කරුණු විභාග කිරීම සිදු කරන අතරතුර ජනාධිපතිවරයා විසින් අත්හිටවනු ලැබිය හැකි ය.

(6) කොමිෂන් සභාවේ සාමාජිකයකුගේ ධුර කාලය ඒ සාමාජිකයා පත් කළ දින සිට වසර තුනක් විය යුතු ය.

(7) කොමිෂන් සභාවේ සාමාජිකයකු මියයාම, ඉල්ලා අස්වීම හෝ වෙනත් යම් හේතුවක් මත ධුරය හිස් කරනු ලැබූ අවස්ථාවක දී, ජනාධිපතිවරයා විසින්, 5 වන සහ 6 වන වගන්තිවල විධිවිධාන සැලකිල්ලට ගනිමින් ඒ සාමාජිකයා වෙනුවට වෙනත් යම් සුදුසු තැනැත්තකු පත් කරනු ලැබිය යුතු අතර, එසේ පත් කරනු ලැබූ තැනැත්තා, ඒ තැනැත්තා විසින් අනුප්‍රාප්ත කරනු ලබන සාමාජිකයාගේ ඉකුත් නොවී ඉතිරිව ඇති ධුර කාලය සඳහා ඒ ධුරය දැරිය යුතු ය.

(8) ඉවත් කිරීමෙන් හැර ස්වකීය ධුර කාලය අවසන් වීමට නියමිත කොමිෂන් සභාවේ සාමාජිකයකු, අඛණ්ඩව හෝ අන්‍යාකාරයෙන් වන තවත් එක් ධුර කාලයක් නොඉක්මවන කාලයක් සඳහා නැවත පත් කිරීම සඳහා සුදුස්සකු වන්නේ ය.

(9) කොමිෂන් සභාවේ සාමාජිකයන්ට පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයක් මගින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි වන යම් පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු අතර, ඒ පාරිශ්‍රමික කොමිෂන් සභාවේ අරමුදලට වැයබරක් විය යුතු ය.

කොමිෂන් සභාවේ සභාපතිවරයා

**8.** (1) ජනාධිපතිවරයා විසින්, කොමිෂන් සභාවේ සාමාජිකයන් අතුරින් එක් අයකු, (මෙහි මින් මතු "සභාපතිවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙස පත් කරනු ලැබිය යුතු ය.

(2) තත් කාර්යය සඳහා ජනාධිපතිවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් සභාපතිවරයාට සභාපති ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, ජනාධිපතිවරයා විසින් ඒ ඉල්ලා අස්වීම ලිඛිතව පිළිගන්නා ලද දින සිට ඒ ඉල්ලා අස්වීම බලාත්මක විය යුතු ය.

(3) සභාපතිවරයා, 6 වන වගන්තිය යටතේ කොමිෂන් සභාවේ සාමාජිකයකු වීමට නුසුදුස්සකු වුවහොත්, සභාපතිවරයා වශයෙන් සිටීම නතර විය යුතු ය.

(4) සභාපතිවරයාගේ ධුර කාලය වසර තුනක් විය යුතු ය.

(5) සභාපතිවරයා, සභාපති ධුරය හිස් කරනු ලැබූ විට දී, සභාපතිවරයා ලෙස නැවත පත් කිරීම සඳහා සුදුස්සකු නොවිය යුතු ය.

(6) මේ වගන්තියේ විධිවිධානවලට අගතියක් නොමැතිව, සභාපතිවරයා ලෙස පත් කරනු ලැබීමෙන් මාසයක් ඇතුළත, අසනීප වීම හෝ වෙනත් යම් හේතුවක් මත සභාපතිවරයාට සිය ධුරයේ කටයුතු කිරීමට නොහැකි වන අවස්ථාවක දී, සිය කර්තව්‍ය ඉටු කිරීම සඳහා නියෝජ්‍ය සභාපතිවරයා ලෙස යම් සාමාජිකයකු ලිඛිතව නම් කරනු ලැබිය යුතු ය.

කොමිෂන් සභාවේ රැස්වීම්

**9.** (1) සභාපතිවරයා විසින් කොමිෂන් සභාවේ සියලු රැස්වීම් කැඳවනු ලැබිය යුතු ය. කොමිෂන් සභාවේ යම් සාමාජිකයකු විසින්, ලිඛිත දැන්වීමක් මගින්, කොමිෂන් සභාවේ රැස්වීමක් කැඳවන ලෙස සභාපතිවරයාගෙන් ඉල්ලීමක් කරනු ලැබිය හැකි අතර, සභාපතිවරයා විසින්, නිසි හේතුවක් මත මිස, එසේ කිරීම ප්‍රතික්ෂේප කරනු නොලැබිය යුතු ය.

(2) කොමිෂන් සභාව විසින්, සාමාජිකයන් බහුතරයකගේ එකඟත්වය ඇතිව හදිසි බවට සභාපතිවරයා විසින් නිශ්චය කරන ලද යම් කරුණක් පිළිබඳ තීරණය කරනු ලැබිය හැකි ය.

(3) සභාපතිවරයා විසින් කොමිෂන් සභාවේ සියලු රැස්වීම්වල මුලසුන දරනු ලැබිය යුතු අතර, සභාපතිවරයා යම් රැස්වීමකට පැමිණ නොසිටින අවස්ථාවක දී, නියෝජ්‍ය සභාපතිවරයා විසින් ඒ රැස්වීමේ මුලසුන දරනු ලැබිය යුතු ය.

(4) කොමිෂන් සභාවේ රැස්වීමක ගණපූරණය සභාපතිවරයා ද ඇතුළුව සාමාජිකයන් තුන්දෙනකු විය යුතු ය. සභාපතිවරයා පැමිණ නොසිටින අවස්ථාවක දී, ගණපූරණය, නියෝජ්‍ය සභාපතිවරයා ද ඇතුළුව සාමාජිකයන් තිදෙනකු විය යුතු ය.

(5) කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය යුතු සියලු කරුණු එකී තීරණය ගනු ලබන රැස්වීමට පැමිණ ඡන්දය දෙන කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය. යම් කරුණක් සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් එසේ තහවුරු කරන ලද තීරණය, ඒ කරුණ සම්බන්ධයෙන් වන කොමිෂන් සභාවේ තීරණය ලෙස සලකනු ලැබිය යුතු ය.

(6) හේතු මගින් තහවුරු කරන ලද කොමිෂන් සභාවේ සියලු තීරණ ලිඛිතව විය යුතු අතර, 10 වන වගන්තියේ (ඇ) ඡේදයට අනුකූලව කොමිෂන් සභාවේ මුද්‍රාව ඊට තබනු ලැබිය යුතු ය.

(7) කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය යුතු යම් කරුණක් සම්බන්ධයෙන් ඡන්ද සමාන වන අවස්ථාවක දී, සභාපතිවරයාට තීරක ඡන්දයක් තිබිය යුතු ය.

(8) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධානවලට යටත්ව, කොමිෂන් සභාව විසින්, එහි රැස්වීම් සහ ඒ රැස්වීම්වල කටයුතු සම්බන්ධයෙන් වන කාර්යපටිපාටිය විධිමත් කරනු ලැබිය හැකි ය.

(9) කොමිෂන් සභාවේ සාමාජිකත්වයේ යම් පුරප්පාඩුවක් පැවතීම හෝ එහි යම් සාමාජිකයකු පත් කිරීමේ දෝෂයක් පැවතීම යන හේතුව නිසාම පමණක් කොමිෂන් සභාවේ යම් ක්‍රියාවක්, තීරණයක් හෝ ක්‍රියාපටිපාටියක් අවලංගු වන ලෙස සලකනු නොලැබිය යුතු ය.

**10.** කොමිෂන් සභාවේ මුද්‍රාව- කොමිෂන් සභාවේ මුද්‍රාව

(අ) කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය යුතු අතර, කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි ආකාරයකට වෙනස් කරනු ලැබිය හැකි ය;

(ආ) කොමිෂන් සභාව විසින් කලින් කල නිශ්චය කරනු ලැබිය හැකි පරිදි වූ යම් තැනැත්තකුගේ භාරයේ තැබිය යුතු ය; සහ

(ඇ) කොමිෂන් සභාවේ අවසරය ඇතිව සහ කොමිෂන් සභාවේ සාමාජිකයන් දෙදෙනෙකු ඉදිරිපිට දී මිස කිසිදු සාධන පත්‍රයකට හෝ ලේඛනයකට අත්සන නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටින බවට සලකුණක් වශයෙන් ඒ සාමාජිකයන් දෙදෙනා විසින් එකී සාධන පත්‍රයට හෝ ලේඛනයට අත්සන් තබනු ලැබිය යුතු ය.

## II වන කොටස

## කොමිෂන් සභාවේ බලතල සහ කර්තව්‍ය

**11.** කොමිෂන් සභාවට පහත දැක්වෙන බලතල සහ කර්තව්‍ය තිබිය යුතු ය:- කොමිෂන් සභාවේ බලතල සහ කර්තව්‍ය

(අ) යම් තහනම් ප්‍රකාශයක් හේතුවෙන් අහිතකර ලෙස බලපෑමට ලක්ව ඇති තැනැත්තන්ට එකී තහනම් ප්‍රකාශයට ප්‍රතිචාර දැක්වීම සඳහා අවස්ථාවක් ලබා දෙන ලෙස නියම කරමින් යම් තහනම් ප්‍රකාශයක් පළ කරනු ලැබ ඇති හෝ සන්නිවේදනය කරනු ලැබ ඇති හෝ යම් තහනම් ප්‍රකාශයක් සන්නිවේදනය කිරීම සඳහා ස්වකීය සේවාවන් භාවිත කරනු ලැබ ඇති තැනැත්තන්ට, අන්තර්ජාල සේවා සපයන්නන්ට හෝ අන්තර්ජාල අතරමැදියන්ට විධාන නිකුත් කිරීම;

(ආ) තහනම් ප්‍රකාශ සන්නිවේදනය කරන තැනැත්තන්ට, එකී ප්‍රකාශ සන්නිවේදනය කිරීම නතර කරන ලෙස දැන්වීම් නිකුත් කිරීම;

(ඈ) තහනම් ප්‍රකාශයක් ඇතුළත් මාර්ගගත ස්ථානයකට ශ්‍රී ලංකාව තුළ සිටින අවසාන පරිශීලකයන් ප්‍රවේශ වීම අක්‍රිය කරන ලෙස හෝ ඒ තහනම් ප්‍රකාශය ඒ මාර්ගගත ස්ථානයෙන් ඉවත් කරන ලෙස අන්තර්ජාල සේවා සපයන්නකුට හෝ අන්තර්ජාල අතරමැදියකුට දැන්වීම් නිකුත් කිරීම;

(ඇ) අධිකරණයට අපහාස විය හැකි හෝ අධිකරණයේ බලය සහ අපක්ෂපාතීත්වය පවත්වාගෙන යාමට අගතිගාමී විය හැකි යම් සන්නිවේදනයන් පිළිබඳ සලකා බැලීම සඳහා එකී සන්නිවේදනයන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 105 වන ව්‍යවස්ථාවේ (3) වන අනුව්‍යවස්ථාව යටතේ හෝ වෙනත් යම් අදාළ ලිඛිත නීතියක් යටතේ උචිත අධිකරණයකට යොමු කිරීම සහ එසේ යම් අධිකරණයකට යොමු කරන ලද යම් කරුණක් සම්බන්ධයෙන් එකී අධිකරණයට අවශ්‍ය විය හැකි යම් සහායක් ලබා දීම;

(ඉ) තහනම් ප්‍රකාශ ඉවත් කිරීම සඳහා අන්තර්ජාල සේවා සපයන්නන්ට සහ අන්තර්ජාල අතරමැදියන්ට නිර්දේශ ඉදිරිපත් කිරීම;

(ඊ) යම් ප්‍රකාශයක අසත්‍යතාවය සම්බන්ධයෙන් මහජනයාට අවබෝධය ලබා දීම සඳහා වන තොරතුරු ඇතුළත් මාර්ගගත පිවිසුමක් පවත්වාගෙන යාම;

(උ) මේ පනතේ විධිවිධාන යටතේ ප්‍රකාශයට පත් කරන ලද මාර්ගගත ස්ථාන නිශ්චිතව දැක්වීම සහ ඒ මාර්ගගත ස්ථාන හරහා පතුරුවා හරිනු ලබන තොරතුරු සඳහා ප්‍රවේශ වීම අක්‍රිය කරන ලෙසට නිර්දේශ ඉදිරිපත් කිරීම;

(ඌ) කොමිෂන් සභාවේ බලතල සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි යම් විමර්ශන සිදු කිරීම;

(එ) ශ්‍රී ලංකාව තුළ සිටින අවසාන පරිශීලකයන්ට අන්තර්ජාලය මත පදනම් වූ සන්නිවේදන සේවා සපයන අන්තර්ජාල සේවා සපයන්නන් සහ අන්තර්ජාල අතරමැදියන් සඳහා රීති මගින් චර්යා සංග්‍රහයන් නිකුත් කිරීම;

(ඒ) ශ්‍රී ලංකාව තුළ සිටින අවසාන පරිශීලකයන්ට සමාජ මාධ්‍ය වේදිකා සපයනු ලබන වෙබ් අඩවි, මේ පනත යටතේ සාදනු ලබන රීති මගින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි ආකාරයට ලියාපදිංචි කිරීම;

(ඔ) කොමිෂන් සභාව විසින් සිය බලතල සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී බලපෑමට ලක්විය හැකි හෝ බලපෑමට ලක්වීමට ඉඩ ඇති යම් තැනැත්තකු හෝ තැනැත්තන් කණ්ඩායමක්, කොමිෂන් සභාව විසින් උචිත යයි සලකනු ලබන තාක් දුරට විමසා සිටීම;

(ඕ) මේ පනතේ විෂය පථය ඇතුළත ශ්‍රී ලංකාව තුළ මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය සම්බන්ධයෙන් වන සියලු කරුණු පිළිබඳව කොමිෂන් සභාව විසින් උචිත යයි සලකනු ලබන පරිදි, ආණ්ඩුවට උපදෙස් ලබා දීම;

(ක) චංචල සහ නිශ්චල දේපළ අත්කර ගැනීම සහ දැරීම සහ ඒ චංචල සහ නිශ්චල දේපළ විකිණීම, බද්දට දීම, උකසට දීම, හුවමාරු කිරීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම;

(ග) එහි බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි යම් ගිවිසුම්වලට එළඹීම;

(ච) කොමිෂන් සභාව විසින් භාර ගෙන සිදු කරනු ලබන යම් විමර්ශන සිදු කිරීමේ දී පොලිසියේ සහාය ලබා ගැනීම;

(ජ) කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් පත් කිරීම, සේවයේ නියුක්ත කරවීම සහ ඉවත් කිරීම සහ එම කාර්ය මණ්ඩලය සම්බන්ධයෙන් විනය පාලනය ක්‍රියාත්මක කිරීම; සහ

(ට) සාමාන්‍යයෙන් මේ පනත යටතේ වන එහි බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම සඳහා අවස්ථානුගත හෝ ආනුෂංගික වන වෙනත් සියලු ක්‍රියා සහ දේ සිදු කිරීම.

III වන කොටස

## අසත්‍ය ප්‍රකාශ මාර්ගගත ලෙස සන්නිවේදනය කිරීම තහනම් කිරීම

ශ්‍රී ලංකාව තුළ අසත්‍ය ප්‍රකාශ සන්නිවේදනය කිරීම තහනම් කිරීම

**12.** අසත්‍ය ප්‍රකාශයක් සන්නිවේදනය කිරීම මගින්, ජාතික ආරක්ෂාවට, මහජන සෞඛ්‍යයට හෝ මහජන සාමයට තර්ජනයක් ඇති කරවන හෝ විවිධ පන්තිවලට අයත් තැනැත්තන් අතර එදිරිවාදී සහ වෛරී හැඟීම් ප්‍රවර්ධනය කරන, ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සිටින යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර, වරදකරු කරනු ලැබූ විට වසර පහක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් ලක්ෂ පහක් නොඉක්මවන දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

අපහාසයට හේතු වන අසත්‍ය ප්‍රකාශයක් සන්නිවේදනය කිරීම

**13.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 105 වන ව්‍යවස්ථාවේ (3) වන අනුව්‍යවස්ථාව යටතේ හෝ වෙනත් යම් අදාළ ලිඛිත නීතියක් යටතේ අධිකරණයට අපහාස කිරීමේ වරද සඳහා දඬුවම් කිරීමට විශේෂ අධිකරණ බලය ක්‍රියාත්මක කරන යම් අධිකරණයක මතය අනුව, අධිකරණයට අපහාස කිරීමක් සිදුවන්නා වූ අසත්‍ය ප්‍රකාශයක් මාර්ගගත ගිණුමක් මඟින් හෝ මාර්ගගත ස්ථානයක් හරහා සන්නිවේදනය කරන, ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සිටින යම් තැනැත්තකු වරදක් සිදු කරන අතර, ඒ ව්‍යවස්ථාවේ සහ අදාළ ලිඛිත නීතියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ තැනැත්තාට දඬුවම් කිරීමේ දී අදාළ විය යුතු ය.

අසත්‍ය ප්‍රකාශයක් මගින් කැරලි ගැසීමක් සිදු කිරීම සඳහා නිකරුණේ ප්‍රකෝප කරවීම

**14.** ප්‍රකෝප කරවීමෙන් හෝ පෙළඹවීමෙන් කැරලි ගැසීමේ වරද සිදුවිය හැකි බවට වූ චේතනාවෙන් ම හෝ ඒ බව දැන දැන ම, ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සිටින යම් තැනැත්තකු විසින්, ද්වේශ සහගතව හෝ නිකරුණේ මාර්ගගත ගිණුමක් මගින් හෝ මාර්ගගත ස්ථානයක් හරහා අසත්‍ය ප්‍රකාශයක් සන්නිවේදනය කිරීමෙන් යම් තැනැත්තකු ප්‍රකෝප කරවනු ලැබූ හෝ පොළඹවනු ලැබූ අවස්ථාවක දී-

(අ) ඒ ප්‍රකෝප කරවීමේ ප්‍රතිඵලයක් වශයෙන් කැරලි ගැසීමේ වරද සිදුකර ඇත්නම්, ප්‍රකෝප කළ තැනැත්තා අවුරුදු

පහක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් ලක්ෂ පහක් නොඉක්මවන දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය; සහ

(ආ) කැරලි ගැසීමේ වරද සිදු නොකළහොත්, ප්‍රකෝප කළ තැනැත්තාට අවුරුදු තුනක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් ලක්ෂ තුනක් නොඉක්මවන දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

අසත්‍ය ප්‍රකාශයක් මගින් ආගමික රැස්වීමකට බාධා කිරීම

**15.** අසත්‍ය ප්‍රකාශයක් සන්නිවේදනය කිරීම මගින් ආගමික වැඳුම් පිදුම් කිරීමක හෝ ආගමික පූජාවන්හි නීත්‍යානුකූලව යෙදී සිටින යම් රැස්වීමකට ස්වේච්ඡාවෙන් ම බාධා කරන ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සිටින යම් තැනැත්තකු වරදක් සිදු කරන අතර වරදකරු කරනු ලැබූ විට වසර තුනක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් ලක්ෂ තුනක් නොඉක්මවන දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

ආගමික හැඟීම් නිග්‍රහයට පාත්‍ර කිරීම සඳහා ඒකාන්තයෙන් සහ ද්වේශ සහගත ලෙස අසත්‍ය ප්‍රකාශයක් සන්නිවේදනය කිරීම

**16.** යම් පන්තියකට අයත් තැනැත්තන්ගේ ආගමික හැඟීම් නිග්‍රහයට පාත්‍ර කිරීමේ ඒකාන්ත සහ ද්වේශ සහගත චේතනාවෙන්, මාර්ගගත ගිණුමක් මගින් හෝ මාර්ගගත ස්ථානයක් හරහා වාචික හෝ ලිඛිත වචන මගින් හෝ දෘශ්‍යමය නිරූපණ මගින් අසත්‍ය ප්‍රකාශයක් සන්නිවේදනය කිරීමෙන් ඒ පන්තියේ ආගමට නැතහොත් ආගමික විශ්වාසවලට නින්දා කරන හෝ නින්දා කිරීමට තැත් කරන ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සිටින යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර, වරදකරු කරනු ලැබූ විට වසර තුනක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් ලක්ෂ තුනක් නොඉක්මවන දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

මාර්ගගතව වංචා කිරීම

**17.** මාර්ගගත ගිණුමක් මගින් හෝ මාර්ගගත ස්ථානයක් හරහා අසත්‍ය ප්‍රකාශයක් සන්නිවේදනය කිරීමෙන් යම් තැනැත්තකු රවටන-

(අ) එසේ රැවටුණු තැනැත්තා, යම් තැනැත්තකුට යම් දේපළක් භාරදීමට හෝ යම් තැනැත්තකු ළඟ යම් දේපළක් තබා ගැනීමට කැමැත්ත දක්වීමට වංචක ලෙස හෝ වංක ලෙස පොළඹවන; හෝ

(ආ) එසේ රැවටුණු තැනැත්තාගේ ශරීරයට, මනසට, කීර්ති නාමයට හෝ දේපළවලට පීඩාවන් සිදුවන නැතහොත් ආණ්ඩුවට හානියක් හෝ පාඩුවක් සිදු කෙරෙන හෝ සිදු කළ හැකි වූ ද, එම තැනැත්තා එසේ නොරැවටී සිටියේ නම්, ඔහු විසින් කරනු නොලබන හෝ නොකර හරිනු නොලබන යම් දෙයක් කිරීමට හෝ නොකර හැරීමට ඒ තැනැත්තා චේතනාන්විතව පොළඹවන,

ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සිටින යම් තැනැත්තකු ''මාර්ගගතව වංචා කිරීමේ'' වරද සිදු කරන අතර, වරදකරු කරනු ලැබූ විට වසර හතක් දක්වා දීර්ඝ විය හැකි කාලසීමාවක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් ලක්ෂ හතක් නොඉක්මවන දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

අනෙකකු ලෙස පෙනී සිටීමෙන් මාර්ගගතව වංචා කිරීම

**18.** මාර්ගගත ගිණුමක් මගින්-

(අ) තමා වෙනත් තැනැත්තකු ලෙස ඇඟවීමෙන්;

(ආ) එක් තැනැත්තකු වෙනුවට තවත් තැනැත්තකු දැන දැනම ආදේශ කිරීමෙන්; හෝ

(ඇ) තමා හෝ වෙනත් යම් තැනැත්තකු සත්‍ය වශයෙන් ම තමා හෝ එකී වෙනත් යම් තැනැත්තා නොවන අන් තැනැත්තකු ලෙස ඉදිරිපත් කිරීමෙන්,

වංචා කරන, ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සිටින යම් තැනැත්තකු, "අනෙකකු ලෙස පෙනී සිටීමෙන් මාර්ගගතව වංචා කිරීමේ" වරද සිදු කරන අතර, වරදකරු කරනු ලැබූ විට වසර

තුනක් දක්වා දීර්ඝ විය හැකි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් ලක්ෂ තුනක් නොඉක්මවන දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

කැරැල්ලක් හෝ රජයට විරුද්ධව වරදක් ආදිය සිදු කිරීමට සැලැස්වීමේ චේතනාවෙන් අසත්‍ය ප්‍රකාශයක් සංසරණය කිරීම

**19.** ශ්‍රී ලංකා නාවික හමුදාවේ, යුද්ධ හමුදාවේ හෝ ගුවන් හමුදාවේ යම් නිලධරයකු, නාවිකයකු, සෙබළකු හෝ ගුවන් නැවියකු කැරලි ගැස්වීමේ චේතනාවෙන් හෝ මහජනයා අතර බියක් හෝ තැතිගැන්මක් ඇති කරවීමේ චේතනාවෙන් යම් අසත්‍ය ප්‍රකාශයක් සන්නිවේදනය කර එමගින් රජයට විරුද්ධ වරදක් හෝ මහජන සාමයට විරුද්ධව වරදක් සිදු කිරීමට යම් තැනැත්තකු පොලඹවන, ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සිටින යම් තැනැත්තකු වරදක් සිදු කරන අතර වරදකරු කරනු ලැබූ විට වසර හතක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් ලක්ෂ හතක් නොඉක්මවන දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

හිරිහැර සිදු කිරීම සඳහා ප්‍රකාශ සන්නිවේදනය කිරීම ආදිය

**20.** (1) (මේ වගන්තියේ "ඉලක්කගත තැනැත්තා" යනුවෙන් සඳහන් කරනු ලබන) වෙනත් යම් තැනැත්තකුට හිරිහැර කිරීමේ චේතනාවෙන්, ඉලක්කගත තැනැත්තාගේ හෝ ඉලක්කගත තැනැත්තාට සම්බන්ධ තැනැත්තකුගේ යම් පෞද්ගලික තොරතුරක් පළ කිරීමෙන් සහ එහි ප්‍රතිඵලයක් වශයෙන් ඉලක්කගත තැනැත්තාට හෝ වෙනත් යම් තැනැත්තකුට හිරිහැරයක් සිදු කරවන, ප්‍රකාශයක් සිතාමතා ම සිදු කරන හෝ සන්නිවේදනය කරන ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සිටින තැනැත්තකු වරදක් සිදු කරන අතර වරදකරු කරනු ලැබූ විට වසර පහක් නොඉක්මවන කාලයකට බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් ලක්ෂ පහක් නොඉක්මවන දඩයකට හෝ යටත් විය යුතු අතර, දෙවන වර හෝ තදනන්තරව වරදකරු කරනු ලැබූ විට ඒ බන්ධනාගාරගත කිරීමේ කාලය හෝ දඩය හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙක ම හෝ දෙගුණයක් කරනු ලැබිය හැකි ය.

(2) මේ වගන්තියේ කාර්යය සඳහා -

(අ) "පෞද්ගලික තොරතුරු" යන්නෙන්, යම් තැනැත්තකු විසින් පෞද්ගලික ලෙස තබාගත යුතු බවට සාධාරණ ලෙස අපේක්ෂා කරනු ලැබිය හැකි යම් ඡායාරූපයක්, හඬ පටයක

හෝ වීඩියෝ පටයක විස්තර ඇතුළු පුද්ගලික තොරතුරු අදහස් වන නමුත් එයට වෙනත් යම් වරදක් සිදු කිරීම සම්බන්ධයෙන් සාක්ෂි විය හැකි යම් තොරතුරු ඇතුළත් නොවේ; සහ

(ආ) "හිරිහැර කිරීම" යන්නෙන්, යම් තැනැත්තකුට තර්ජනය කිරීමේ, තැති ගැන්වීමේ හෝ පීඩාවට පත් කිරීමේ හෝ යම් තැනැත්තකුගේ අභිමානය උල්ලංඝනය කිරීමේ හෝ බියගන්වනසුළු, අවමන් සහගත, එදිරිවාදී, නින්දා සහගත හෝ වරදකාරී පරිසරයක් නිර්මාණය කිරීමේ බලපෑමක් ඇති හෝ ඒ සියලු බලපෑම් ඇති යම් ක්‍රියාවක් හෝ හැසිරීමක් අදහස් වේ.

නිදර්ශන-

(අ) "එක්ස්" සහ "වයි" අතර මින් පෙර සම්බන්ධතාවයක් පැවතිය ද දැන් එම සම්බන්ධතාවය අවසන් වී ඇත. "වයි" හට හිරිහැර කිරීමේ අදහසින්, වෙනත් තැනැත්තන්ට "වයි" හඳුනාගැනීමට පහසුකම් සලසමින් හෝ "වයි" සම්බන්ධ කර ගැනීමට හැකි වන පරිදි "වයි"ගේ ඡායාරූප සහ පෞද්ගලික ජංගම දුරකථන අංකය ඇතුළත් කරමින්, "එක්ස්" විසින් සමාජ මාධ්‍ය වේදිකාවක පළ කිරීමක් ලියනු ලබයි. "වයි" පළ කිරීම නොදුටු නමුත් (ඒ පළ කිරීම කියවන ලද) නන්නාඳුනන තැනැත්තන්ගෙන් ලිංගික කටයුතුවලට එක්වන ලෙසට යෝජනා කරමින් දුරකථන ඇමතුම් සහ කෙටි පණිවුඩ සේවාව හරහා කෙටි පණිවුඩ ලැබෙන අතර, එමගින් "වයි" හිරිහැරයට පත් වේ. ඒ පළ කිරීමට අදාළව මේ වගන්තිය යටතේ "එක්ස්" වරදකට වරදකරු වේ.

(ආ) "එක්ස්" හා "වයි" අතර මින් පෙර සම්බන්ධතාවයක් පැවතිය ද දැන් එම සම්බන්ධතාවය අවසන් වී ඇත. "වයි" විසින් පෞද්ගලික ලෙස තබාගත යුතු බවට සාධාරණ ලෙස අපේක්ෂා කරනු ලැබිය හැකි, "එක්ස්" සන්තකයේ ඇති "වයි" ගේ ඡායාරූපයක් "එක්ස්" විසින් පළ කරනු ලැබේ. ඒ පළ කිරීමට අදාළව, මේ වගන්තිය යටතේ "එක්ස්" වරදකට වරදකරු වේ.

ළමා අපයෝජන ආදිය

**21.** (1) මාර්ගගත ගිණුමක් මගින් හෝ මාර්ගගත ස්ථානයක් හරහා දණ්ඩ නීති සංග්‍රහයේ 286අ, 288, 288අ, 288ආ, 308අ, 360අ, 360ආ, 360ඇ, 363, 364අ, 365, 365අ හෝ 365ආ වන වගන්තියේ අර්ථානුකූලව වරදක් සංයුක්ත වන ක්‍රියාවක් ළමයකු සම්බන්ධයෙන්

සිදුකරන හෝ එවැනි ක්‍රියාවකට ආධාර දෙන සහ අනුබල දෙන, ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සිටින යම් තැනැත්තකු වරදක් සිදු කරන අතර, වරදකරු කරනු ලැබූ විට මෙහි උපලේඛනයේ ඒ එක් එක් වරද සඳහා නිශ්චිතව දක්වා ඇති දඬුවමට යටත් විය යුතු ය:

එසේ වුව ද, ළමයකු සම්බන්ධයෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 363 වන වගන්තිය යටතේ වරදක් සිදු කිරීමට ආධාර කිරීමක දී සහ අනුබල දීමක දී, මේ වගන්තියේ කාර්යය සඳහා දණ්ඩ නීති සංග්‍රහයේ 364 වන වගන්තියේ (2) වන උපවගන්තියේ "ස්ත්‍රියක්" යනුවෙන් යෙදෙන සෑම සඳහනක් ම "ළමයකු" ලෙසට කියවා තේරුම් ගත යුතු ය.

(2) මාර්ගගත ගිණුමක් මගින් හෝ මාර්ගගත ස්ථානයක් හරහා ළමයකුට අදාළව අපයෝජන ස්වභාවයෙන් යුතු හෝ කාමෝද්දීපන ස්වභාවයෙන් යුතු යම් ඡායාරූපයක්, හඬ පටයක් හෝ වීඩියෝ පටයක් පළ කරන, ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සිටින යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර, වරදකරු කරනු ලැබූ විට වසර දෙකකට නොඅඩු සහ වසර විස්සක් නොඉක්මවන කාලයකට බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් මිලියන එකක් නොඉක්මවන දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ වූ වරදකට යම් තැනැත්තකු වරදකරු කරනු ලැබූ විට, ඒ තැනැත්තා විසින් ඒ වගන්තියේ නිශ්චිතව දක්වා ඇති දණ්ඩනයට අමතරව අධිකරණය විසින් ආඥා කරනු ලැබිය හැකි වූ යම් වන්දියක්, එම වරද සිදු වූයේ කවර ළමයකු හෝ ළමයින් කණ්ඩායමක් සම්බන්ධයෙන් ද ඒ ළමයාට හෝ ළමයින් කණ්ඩායමට ගෙවීමට යටත් විය යුතු ය.

වරදක් සිදු කිරීම සඳහා බොට් සෑදීම හෝ වෙනස් කිරීම

**22.** මේ පනත යටතේ වූ වරදක් සංයුක්ත වන ප්‍රකාශයක්, බොට් මගින් සන්නිවේදනය කිරීමේ හෝ වෙනත් තැනැත්තකුට සන්නිවේදනය කිරීමට ඉඩ ලබා දීමේ අදහසින් බොට් සාදනු ලබන හෝ බොට් වෙනස් කරනු ලබන ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සිටින තැනැත්තකු වරදක් සිදු කරන අතර, වරදකරු කරනු ලැබූ විට වසර පහක් නොඉක්මවන කාලයකට බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් ලක්ෂ පහක් නොඉක්මවන දඩයකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

IV වන කොටස

## ශ්‍රී ලංකාව තුළ තහනම් ප්‍රකාශ මාර්ගගතව සන්නිවේදනය කිරීමට එරෙහි පියවර

තහනම් ප්‍රකාශය සන්නිවේදනය කිරීම සම්බන්ධයෙන් කොමිෂන් සභාවට තොරතුරු සැපයීම

**23.** (1) (මේ පනතේ "අවසාන පරිශීලකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) අන්තර්ජාලය මත පදනම් වූ සන්නිවේදන සේවා පරිශීලකයන් විසින් දකිනු ලබන, අසනු ලබන හෝ වෙනත් ආකාරයකට දැනගනු ලබන තහනම් ප්‍රකාශයක් වෙනත් යම් තැනැත්තකු විසින් සන්නිවේදනය කිරීම මගින් අගතියට පත් යම් තැනැත්තකුට, ලිඛිතව හෝ ඉලෙක්ට්‍රොනික ආකාරයෙන්, ඒ සන්නිවේදනයට අදාළ තොරතුරු සපයමින් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් කළ හැකි ය.

(2) කොමිෂන් සභාව විසින්, (1) වන උපවගන්තියේ කාර්යය සඳහා තහනම් ප්‍රකාශයක් සන්නිවේදනය කිරීමට අදාළ තොරතුරු ලබා ගැනීම සඳහා, කලින් කලට කොමිෂන් සභාව විසින් අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි පරිදි කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය අතරින් යම් තොරතුරු නිලධාරීන් සංඛ්‍යාවක් නම් කරනු ලැබිය යුතු ය.

(3) (අ) තහනම් ප්‍රකාශය සන්නිවේදනය කරනු ලැබ ඇත්තේ හෝ පළ කරනු ලැබ ඇත්තේ කවර ස්ථානයකින් හෝ අංකයකින් ද, ඒ ස්ථානයේ හෝ අංකයේ (මින් මතු "යූ.ආර්.එල්." යනුවෙන් සඳහන් කරනු ලබන) යුනිවර්සල් රිසෝස් ලොකේටරයට හෝ වෙනත් යම් හඳුනාගත හැකි ලක්ෂණවලට අදාළ විස්තර ඇති අවස්ථාවක දී, ඒ තොරතුරු ද, නියම කරනු ලැබිය හැකි වෙනත් යම් විස්තර ද ඇතුළත්ව එකී තහනම් ප්‍රකාශය සිදු කිරීම හෝ සන්නිවේදනය කිරීම සඳහා වගකිව යුතු තැනැත්තා හෝ තැනැත්තන් පිළිබඳව පවතින සියලු විස්තර, සෑම පැමිණිල්ලක ම දැක්විය යුතු ය.

(ආ) පැමිණිලිකරු විසින්, එසේ කිරීමට හැකියාව පවතින අවස්ථාවක දී, පැමිණිල්ලේ පිටපතක් තහනම් ප්‍රකාශය සිදු කරන ලද හෝ සන්නිවේදනය කරන ලද තැනැත්තාට හෝ තැනැත්තන්ට සහ යම් අන්තර්ජාල සේවා සපයන්නකුට හෝ අන්තර්ජාල අතරමැදියකුට භාරදෙනු ලැබිය යුතු ය.

(ඇ) ඉහත සඳහන් පරිදි දැන්වීම ලබා දීම සඳහා අවශ්‍ය තොරතුරු නොමැති නම්, එවැනි අවස්ථාවක දී, පැමිණිලිකරු විසින් එකී තොරතුරු නොමැති බව පැමිණිල්ලෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය යුතු ය.

(4) තොරතුරු නිලධරයා විසින්, වහාම, එකී තොරතුර ලැබුණු බවට, ඉලෙක්ට්‍රොනික ආකාරයේ ලදුපතක් ද ඇතුළුව වන ලිඛිත පිළිගැනුමක් කොමිෂන් සභාව වෙනුවෙන් නිකුත් කරනු ලැබිය යුතු ය.

(5) තහනම් ප්‍රකාශයක් සන්නිවේදනය කර ඇති බවට ප්‍රමාණවත් කරුණු පවතින බව කොමිෂන් සභාවේ මතය වන අවස්ථාවක දී, කොමිෂන් සභාව විසින්, කොමිෂන් සභාවේ නිලධරයන් මගින් පරීක්ෂණ සිදු කළ යුතු ය. එකී පරීක්ෂණ අතරතුර දී, එකී තහනම් ප්‍රකාශය සන්නිවේදනය කළ බවට චෝදනා ලද තැනැත්තාට කරුණු කියාපෑමට අවස්ථාවක් දෙනු ලැබිය යුතු ය.

(6) (අ) තහනම් ප්‍රකාශයක් සිදු කර ඇති බවට ප්‍රමාණවත් කරුණු පවතින බවට කොමිෂන් සභාව සෑහීමකට පත් වන අවස්ථාවක දී, කොමිෂන් සභාව විසින්, ඒ කාරණයෙහි බැරෑරුම්කම සහ එකී තහනම් ප්‍රකාශයෙන් හානියක් හෝ පීඩාවක් සිදු වීමට ඇති හැකියාව සැලකිල්ලට ගනිමින්, එකී තහනම් ප්‍රකාශය සංසරණය වීම වැළැක්වීමට පියවර ගන්නා ලෙස, එකී ප්‍රකාශය සන්නිවේදනය කරන ලද තැනැත්තාට දැන්වීමක් නිකුත් කරනු ලැබිය හැකි ය.

(ආ) (අ) ඡේදය යටතේ දැන්වීමක් නිකුත් කරනු ලබන්නේ යම් තැනැත්තකුට ද, ඒ තැනැත්තා විසින්, වහාම, එහෙත් ඒ දැන්වීම නිකුත් කිරීමෙන් පැය විසි හතරක් පසු නොවන පරිදි ඒ විධානයට අනුකූලව කටයුතු කරනු ලැබිය යුතු ය.

(ඇ) (අ) ඡේදයේ සඳහන් දැන්වීම, පුද්ගලිකව භාරදෙනු ලැබුවහොත්, එකී තහනම් ප්‍රකාශය සන්නිවේදනය කළ තැනැත්තාගේ අවසන්වරට සිටි බවට සැලකෙන ලිපිනයට තැපැල් මාර්ගයෙන් යවනු ලැබුවහොත් හෝ එකී තැනැත්තා වෙත ඉලෙක්ට්‍රොනික මාර්ගයෙන් භාරදෙනු ලැබුවහොත් හෝ සිදුවීමේ ස්වභාවය මත පදනම්ව, කොමිෂන් සභාව විසින් යොදාගනු ලබන වෙනත් යම් උචිත ක්‍රමයකින් භාරදෙනු ලැබුවහොත්, ඒ දැන්වීම භාර දෙනු ලැබූ බවට සලකනු ලැබිය යුතු ය.

(ඇ) (අ) ඡේදයේ සඳහන් දැන්වීම, ඒ තැනැත්තාගේ විද්‍යුත් තැපැල් ලිපිනය වෙත හෝ සමාජ මාධ්‍ය ගිණුම වෙත හෝ ඒ තහනම් ප්‍රකාශය සන්නිවේදනය කරන ලද්දේ කවර අන්තර්ජාල සේවා සපයන්නකුගේ හෝ අන්තර්ජාල අතරමැදියකුගේ මාර්ගගත ස්ථානයක ද ඒ අන්තර්ජාල සේවා සපයන්නාගේ හෝ අන්තර්ජාල අතරමැදියාගේ විද්‍යුත් තැපැල් ලිපිනය වෙත හෝ සමාජ මාධ්‍ය ගිණුම වෙත යවනු ලැබීමෙන්, ඒ දැන්වීම ඉලෙක්ට්‍රොනික මාර්ගයෙන් භාරදෙනු ලැබූ බවට සලකනු ලැබිය යුතු ය.

(7) (6) වන උපවගන්තිය යටතේ නිකුත් කරනු ලබන දැන්වීමකට, එකී දැන්වීමෙන් පැය විසි හතරක් ඇතුළත අනුකූලව කටයුතු කිරීම යම් තැනැත්තකු විසින් පැහැර හරිනු ලබන අවස්ථාවක දී, කොමිෂන් සභාව විසින්, අවස්ථාවෝචිත පරිදි, ඒ දැන්වීමේ නිශ්චිතව දක්වනු ලබන කාලයක් සඳහා-

(අ) ඒ තහනම් ප්‍රකාශය වෙත ශ්‍රී ලංකාව තුළ සිටින අවසාන පරිශීලකයන් විසින් ප්‍රවේශ වනු ලැබීම අක්‍රිය කරන ලෙස; හෝ

(ආ) ඒ තහනම් ප්‍රකාශය ඒ මාර්ගගත ස්ථානයෙන් ඉවත් කරන ලෙස,

ඒ තහනම් ප්‍රකාශය සන්නිවේදනය කරන ලද්දේ කවර අන්තර්ජාල සේවා සපයන්නකුගේ හෝ අන්තර්ජාල අතරමැදියකුගේ මාර්ගගත ස්ථානයක ද, ඒ අන්තර්ජාල සේවා සපයන්නා වෙත හෝ අන්තර්ජාල අතරමැදියා වෙත දැන්වීමක් නිකුත් කළ යුතු ය.

(8) (7) වන උපවගන්තිය යටතේ දැන්වීමක් නිකුත් කරනු ලැබූ අන්තර්ජාල සේවා සපයන්නකු හෝ අන්තර්ජාල අතරමැදියකු ඒ දැන්වීම නිකුත් කිරීමෙන් පැය විසි හතරක් තුළ ඒ දැන්වීමට අනුකූලව ක්‍රියාකරනු ලැබිය යුතු ය.

(9) (අ) (6) වන උපවගන්තියේ (ආ) ඡේදයේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීම යම් තැනැත්තකු පැහැර හරින අවස්ථාවක දී; හෝ

(ආ) (8) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීම යම් අන්තර්ජාල සේවා සපයන්නකු හෝ අන්තර්ජාල අතරමැදියකු පැහැර හරින අවස්ථාවක දී,

අවස්ථාවෝචිත පරිදි, ඒ තැනැත්තාට හෝ අන්තර්ජාල සේවා සපයන්නාට හෝ අන්තර්ජාල අතරමැදියාට, එකී විධිවිධානවලට අනුකූල වන ලෙසට විධාන කරන ආඥාවක් ලබා ගැනීම සඳහා පෙත්සමක් සහ දිවුරුම් ප්‍රකාශයක් මගින්, කොමිෂන් සභාව විසින්, මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි අතර 24 වන වගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, එකී ඉල්ලීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

තහනම් ප්‍රකාශ සංසරණය වීම වැළැක්වීම පිණිස අධිකරණ ආඥාවක් ඉල්ලීම

**24.** (1) තහනම් ප්‍රකාශයක් සන්නිවේදනය වීමෙන් බලපෑමට ලක්ව ඇති තැනැත්තකු විසින්, ඒ තොරතුර සංසරණය වීම වැළැක්වීම පිණිස ආඥාවක් ලබා ගැනීම සඳහා පෙත්සමක් සහ දිවුරුම් ප්‍රකාශයක් මගින් මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(2) ඒ ඉල්ලීම සලකා බැලීමෙන් පසු, මහෙස්ත්‍රාත්වරයා විසින්, ඒ තැනැත්තා වෙත හෝ ඒ තහනම් ප්‍රකාශය සන්නිවේදනය කර ඇත්තේ කවර අන්තර්ජාල සේවා සපයන්නකුගේ හෝ අන්තර්ජාල අතරමැදියකුගේ මාර්ගගත ස්ථානයකින් ද ඒ අන්තර්ජාල සේවා සපයන්නා වෙත හෝ අන්තර්ජාල අතරමැදියා වෙත කොන්දේසි සහිත ආඥාවක් නිකුත් කරනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තිය යටතේ කරනු ලබන ආඥාවක, වෙනත් කරුණු අතර-

(අ) වහාම ක්‍රියාත්මක වන පරිදි තහනම් ප්‍රකාශය සන්නිවේදනය කිරීම නැවැත්වීමට අවශ්‍ය වන තැනැත්තාගේ නම; සහ

(ආ) මහෙස්ත්‍රාත්වරයා විසින් සුදුසු යයි සලකනු ලබන වෙනත් යම් ආඥාවක්,

අන්තර්ගත විය හැකි ය.

(4) (අ) (2) වන උපවගන්තිය යටතේ කරනු ලබන ආඥාවක්, ඒ ආඥාව පුද්ගලිකව භාරදෙනු ලැබුවහොත්, ඒ තැනැත්තා අවසන් වරට සිටි බවට සැලකෙන ලිපිනයට තැපැල් මාර්ගයෙන් යවනු ලැබුවහොත් හෝ ඉලෙක්ට්‍රොනික මාර්ගයෙන් ඒ තැනැත්තා වෙත භාරදෙනු ලැබුවහොත් හෝ සිදුවීමේ ස්වභාවය මත පදනම්ව මහෙස්ත්‍රාත්වරයා විසින් ආඥාවක් කරනු ලබන වෙනත් යම් උචිත ක්‍රමයක් මගින් භාරදෙනු ලැබුවහොත්, ඒ ආඥාව භාරදෙනු ලැබූ බවට සලකනු ලැබිය යුතු ය.

(ආ) (2) වන උපවගන්තිය යටතේ කරන ලද ආඥාවක්, ඒ තැනැත්තාගේ විද්‍යුත් තැපැල් ලිපිනය වෙත හෝ සමාජ මාධ්‍ය ගිණුම වෙත හෝ ඒ තහනම් ප්‍රකාශය සන්නිවේදනය කරන ලද්දේ කවර අන්තර්ජාල සේවා සපයන්නකුගේ හෝ අන්තර්ජාල අතරමැදියකුගේ මාර්ගගත ස්ථානයක ද, ඒ අන්තර්ජාල සේවා සපයන්නාගේ හෝ අන්තර්ජාල අතරමැදියාගේ විද්‍යුත් තැපැල් ලිපිනය වෙත හෝ සමාජ මාධ්‍ය ගිණුම වෙත හෝ යවනු ලැබුවහොත්, ඒ ආඥාව ඉලෙක්ට්‍රොනික මාර්ගයෙන් භාරදෙනු ලැබූ බවට සලකනු ලැබිය යුතු ය.

(5) (2) වන උපවගන්තිය යටතේ කොන්දේසි සහිත ආඥාවක් කරනු ලබන්නේ යම් තැනැත්තකුට විරුද්ධව ද, ඒ තැනැත්තා විසින්, ඒ ආඥාවට අනුකූලව කටයුතු කිරීම හෝ ඒ ආඥාව නියත කරනු නොලැබිය යුත්තේ මන්ද යන්න සම්බන්ධයෙන් හේතු දැක්වීම සඳහා (6) වන උපවගන්තියේ නිශ්චිතව දැක්වෙන පරිදි මහෙස්ත්‍රාත්වරයා ඉදිරියේ පෙනී සිටීම කරනු ලැබිය යුතු ය.

(6) (2) වන උපවගන්තිය යටතේ කොන්දේසි සහිත ආඥාවක් කරනු ලබන්නේ යම් තැනැත්තකුට එරෙහිව ද ඒ තැනැත්තා විසින්, හේතු දැක්වීමට අදහස් කරනු ලබන අවස්ථාවක දී, ඒ තැනැත්තා විසින්, ඒ ආඥාව කරනු ලැබූ දින සිට සති දෙකක කාලසීමාවක් ඇතුළත ඒ ආඥාව කරනු ලැබූ මහෙස්ත්‍රාත්වරයා ඉදිරියේ පෙනී සිට මෙහි මින් මතු දක්වා ඇති ආකාරයට ඒ ආඥාව ඉවත් කරන ලෙස හෝ වෙනස් කරන ලෙස හෝ ඉල්ලා සිටිනු ලැබිය යුතු ය.

(7) (2) වන උපවගන්තිය යටතේ ආඥාවක් කරනු ලබන්නේ යම් තැනැත්තකුට විරුද්ධව ද ඒ තැනැත්තා විසින් ඒ ආඥාවට අනුකූලව කටයුතු කිරීම හෝ (6) වන උපවගන්තිය යටතේ මහෙස්ත්‍රාත්වරයා

ඉදිරියේ පෙනී සිටීම හෝ සිදු කරනු නොලැබුවහොත්, ඒ තැනැත්තා (9) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති දණ්ඩනයට යටත් විය යුතු අතර, ඒ ආඥාව නියත කරනු ලැබිය යුතු ය.

(8) (අ) පෙත්සමක් සහ දිවුරුම් ප්‍රකාශයක් මගින් හේතු දැක්වීම සඳහා, ඒ තැනැත්තා (6) වන උපවගන්තිය ප්‍රකාරව මහෙස්ත්‍රාත්වරයා ඉදිරියේ පෙනී සිටින අවස්ථාවක දී, මහෙස්ත්‍රාත්වරයා විසින් පරීක්ෂණයක් පවත්වනු ලැබිය යුතු අතර, ඒ පරීක්ෂණය, එය ආරම්භ කරනු ලබන දින සිට සති දෙකක් ඇතුළත අවසන් කරනු ලැබිය යුතු ය.

(ආ) මහෙස්ත්‍රාත්වරයා විසින්, (2) වන උපවගන්තිය යටතේ කොන්දේසි සහිත ආඥාවක් කරනු ලැබ ඇත්තේ යම් තැනැත්තකුට විරුද්ධව ද, ඒ තැනැත්තා විසින් ප්‍රකාශ කරනු ලබන කරුණු සැලකිල්ලට ගනිමින්, මේ වගන්තිය යටතේ වූ ආඥාව සාධාරණ නොවන බවට සහ සුදුසු නොවන බවට තමා සෑහීමට පත් වන්නේ නම්, ඒ ආඥාව ඉවත් කිරීම හෝ වෙනස් කිරීම හෝ සිදු කරනු ලැබිය හැකි අතර මේ පනතේ විධිවිධානවලට යටත්ව උචිත ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(ඇ) මහෙස්ත්‍රාත්වරයා එසේ සෑහීමට පත් නොවුනහොත්, (2) වන උපවගන්තිය යටතේ කරන ලද ආඥාව නියත කරනු ලැබිය යුතු ය.

(ඈ) (2) වන උපවගන්තිය යටතේ කරනු ලබන ආඥාව, (ආ) ඡේදය යටතේ වෙනස් කරනු ලබන අවස්ථාවක දී, ඒ ආඥාව නියත කරනු ලැබිය යුතු ය.

(9) මේ වගන්තිය යටතේ ආඥාවක් කරනු ලබන්නේ යම් තැනැත්තකුට විරුද්ධව ද ඒ තැනැත්තා මහෙස්ත්‍රාත්වරයා විසින් ආඥාවක් කරනු ලබන කාලසීමාව ඇතුළත සහ මහෙස්ත්‍රාත්වරයා විසින් ආඥාවක් කරනු ලබන ආකාරයට අනුව, ඒ ආඥාවට අනුකූලව කටයුතු කිරීමට පැහැර හරින අවස්ථාවක දී, වරදක් සිදු කරනු ලබන අතර, වරදකරු කරනු ලැබූ විට වසර පහක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් මිලියන දෙකක් නොඉක්මවන දඩයකට හෝ යටත් විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයා විසින්-

(අ) ශ්‍රී ලංකාව තුළ ඒ තහනම් ප්‍රකාශය පිළිබඳ සන්නිවේදනය අන්තර්ගත මාර්ගගත ස්ථානය වෙත ශ්‍රී ලංකාව තුළ සිටින අවසාන පරිශීලකයන් ප්‍රවේශ වීම අක්‍රිය කිරීම සඳහා; හෝ

(ආ) ඒ සන්නිවේදනය අන්තර්ගත මාර්ගගත ස්ථානයෙන් අදාළ තහනම් ප්‍රකාශය පිළිබඳ සන්නිවේදනය ඉවත් කිරීම සඳහා,

අවශ්‍ය පියවර ගන්නා ලෙස කොමිෂන් සභාවට ආඥාවක් කරනු ලැබිය හැකි ය.

අනන්‍යතා තොරතුරු හෙළිදරව් කිරීම

**25.** (1) තහනම් ප්‍රකාශයක් සන්නිවේදනය කිරීම මගින් යම් තැනැත්තකු අගතියට පත්ව ඇති සහ 23 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ පැමිණිල්ලේ පිටපතක් භාර දීම සඳහා අවශ්‍ය වන්නා වූ තොරතුරු නොමැති අවස්ථාවක දී, ඒ තැනැත්තා විසින්, 23 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ කරනු ලබන පැමිණිල්ලේ ඒ තොරතුරු නොමැති බව නිශ්චිතව සඳහන් කළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් පැමිණිල්ලක් ලැබුණු විට, තහනම් ප්‍රකාශය සන්නිවේදනය කරන ලද තැනැත්තාගේ අනන්‍යතාවය පිළිබඳ තොරතුරු හෙළිදරව් කරන ලෙසට, ඒ තහනම් ප්‍රකාශය සන්නිවේදනය කරන ලද්දේ කවර අන්තර්ජාල අතරමැදියකුගේ මාර්ගගත ස්ථානයක ද ඒ අන්තර්ජාල අතරමැදියා වෙත විධාන කරමින් කොන්දේසි සහිත ආඥාවක් කරන ලෙස ඉල්ලමින් කොමිෂන් සභාව විසින් මහෙස්ත්‍රාත් අධිකරණය වෙත පෙත්සමක් සහ දිවුරුම් ප්‍රකාශයක් මගින් ඉල්ලීමක් කරනු ලැබිය යුතු ය.

(3) මහෙස්ත්‍රාත්වරයා-

(අ) ඒ ප්‍රකාශය තහනම් ප්‍රකාශයක් බවට;

(ආ) ආඥාව ඉල්ලා සිටින්නේ තහනම් ප්‍රකාශය සිදු කරන ලද තැනැත්තා හඳුනාගැනීමේ එක ම අරමුණ සඳහා ම වන බවට; සහ

(ඇ) හඳුනාගැනීමට ඉල්ලා සිටින තැනැත්තාගේ යම් විරුද්ධ අයිතියක් හෝ හිමිකමක් මගින් තොරතුරු හෙළිදරව් කිරීමට පෙත්සම්කරුට ඇති අයිතිය ඉක්මවා තිබේ ද යන්න සැලකිල්ලට ගනිමින්, ආඥාව, අධිකරණය ඉදිරියේ ඇති කාරණයේ සියලු අවස්ථානුගත කරුණු පිළිබඳ සමානුපාතික සහ අවශ්‍ය ප්‍රතිචාරයක් බවට,

සෑහීමට පත් වීමෙන් පසුව, කොමිෂන් සභාව විසින් ඉල්ලා සිටින ආඥාව නිකුත් කරනු ලැබිය හැකි ය.

(4) (3) වන උපවගන්තිය යටතේ කරනු ලබන ආඥාවක, වෙනත් කරුණු අතර-

(අ) ඉල්ලා සිටින තොරතුරු හෙළිදරව් කළ යුතු වන අන්තර්ජාල අතරමැදියාගේ නම; සහ

(ආ) මහෙස්ත්‍රාත්වරයා විසින් සුදුසු යයි සලකනු ලබන වෙනත් යම් ආඥාවක්,

අන්තර්ගත විය හැකි ය.

(5) (අ) (3) වන උපවගන්තිය යටතේ කරනු ලබන ආඥාව පුද්ගලිකව භාරදෙනු ලැබුවහොත් හෝ ඒ අන්තර්ජාල අතරමැදියා අවසන් වරට සිටි බවට සැලකෙන ලිපිනයට තැපැල් මාර්ගයෙන් යවනු ලැබුවහොත් හෝ ඉලෙක්ට්‍රොනික මාර්ගයෙන් ඒ අන්තර්ජාල අතරමැදියා වෙත භාරදෙනු ලැබුවහොත් හෝ නඩුවේ ස්වභාවය මත පදනම්ව මහෙස්ත්‍රාත්වරයා විසින් ආඥාවක් කරනු ලබන වෙනත් යම් උචිත ක්‍රමයක් මගින් භාරදෙනු ලැබුවහොත්, ඒ ආඥාව භාර දෙනු ලැබූ බවට සලකනු ලැබිය යුතු ය.

(ආ) (3) වන උපවගන්තිය යටතේ කරනු ලබන ආඥාව, එකී තහනම් ප්‍රකාශය සන්නිවේදනය කරන ලද්දේ කවර අන්තර්ජාල අතරමැදියකුගේ මාර්ගගත ස්ථානයකින් ද, ඒ අන්තර්ජාල අතරමැදියාගේ විද්‍යුත් තැපැල් ලිපිනයට හෝ සමාජ මාධ්‍ය ගිණුමට යවනු ලැබුවහොත් ඒ ආඥාව ඉලෙක්ට්‍රොනික මාර්ගයෙන් භාර දෙනු ලැබූ බවට සලකනු ලැබිය යුතු ය.

(6) (3) වන උපවගන්තිය යටතේ කොන්දේසි සහිත ආඥාවක් කරනු ලබන්නේ කවර අන්තර්ජාල අතරමැදියෙකුට විරුද්ධව ද, ඒ අන්තර්ජාල අතරමැදියා විසින්, ඒ ආඥාවට අනුකූලව කටයුතු කිරීම හෝ ඒ ආඥාව නියත කරනු නොලැබිය යුත්තේ මන්ද යන්න සම්බන්ධයෙන් හේතු දැක්වීම සඳහා (7) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති පරිදි මහෙස්ත්‍රාත්වරයා ඉදිරියේ පෙනී සිටීම කරනු ලැබිය යුතු ය.

(7) (3) වන උපවගන්තිය යටතේ කොන්දේසි සහිත ආඥාවක් කරනු ලබන්නේ කවර අන්තර්ජාල අතරමැදියකුට විරුද්ධව ද ඒ අන්තර්ජාල අතරමැදියා විසින් හේතු දැක්වීමට අදහස් කරනු ලබන අවස්ථාවක දී, ඒ අන්තර්ජාල අතරමැදියා විසින්, ඒ ආඥාව කරනු ලැබූ දිනයේ සිට සති දෙකක කාලසීමාවක් ඇතුළත ඒ ආඥාව කරනු ලැබූ මහෙස්ත්‍රාත්වරයා ඉදිරියේ පෙනී සිට මෙහි මින් මතු දක්වා ඇති ආකාරයට ඒ ආඥාව ඉවත් කරන ලෙස හෝ වෙනස් කරන ලෙස හෝ ඉල්ලා සිටිනු ලැබිය යුතු ය.

(8) (3) වන උපවගන්තිය යටතේ ආඥාවක් කරනු ලබන්නේ කවර අන්තර්ජාල අතරමැදියකුට විරුද්ධව ද ඒ අන්තර්ජාල අතරමැදියා විසින් ඒ ආඥාවට අනුකූලව කටයුතු කිරීම හෝ (7) වන උපවගන්තිය යටතේ මහෙස්ත්‍රාත්වරයා ඉදිරියේ පෙනී සිටීම හෝ සිදු කරනු නොලැබුවහොත් ඒ අන්තර්ජාල අතරමැදියා (10) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති දඩයකට යටත් විය යුතු අතර ඒ ආඥාව නියත කරනු ලැබිය යුතු ය.

(9) (අ) පෙත්සමක් සහ දිවුරුම් ප්‍රකාශයක් මගින් හේතු දැක්වීම සඳහා ඒ අන්තර්ජාල අතරමැදියා විසින් (7) වන උපවගන්තිය යටතේ අධිකරණය ඉදිරියේ පෙනී සිටින අවස්ථාවක දී, මහෙස්ත්‍රාත්වරයා විසින් පරීක්ෂණයක් පවත්වනු ලැබිය යුතු අතර ඒ පරීක්ෂණය, එය ආරම්භ කරනු ලබන දින සිට සති දෙකක් ඇතුළත අවසන් කරනු ලැබිය යුතු ය.

(ආ) මහෙස්ත්‍රාත්වරයා විසින්, (3) වන උපවගන්තිය යටතේ කොන්දේසි සහිත ආඥාවක් කරනු ලැබ ඇත්තේ කවර අන්තර්ජාල අතරමැදියකුට විරුද්ධව ද ඒ අන්තර්ජාල අතරමැදියා විසින් ප්‍රකාශ

කරනු ලබන කරුණු සැලකිල්ලට ගනිමින් මේ වගන්තිය යටතේ වූ ආඥාව සාධාරණ නොවන බවට සහ සුදුසු නොවන බවට තමා සෑහීමකට පත් වන්නේ නම්, ඒ ආඥාව ඉවත් කිරීම හෝ වෙනස් කිරීම හෝ සිදු කරනු ලැබිය යුතු අතර මේ පනතේ විධිවිධානවලට යටත්ව උචිත ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(ඇ) මහෙස්ත්‍රාත්වරයා එසේ සෑහීමකට පත් නොවුනහොත්, (3) වන උපවගන්තිය යටතේ කරන ලද ආඥාව නියත කරනු ලැබිය යුතු ය.

(ඇ) (3) වන උපවගන්තිය යටතේ කරන ලද ආඥාව, (ආ) ඡේදය යටතේ වෙනස් කරනු ලබන අවස්ථාවක දී, ඒ ආඥාව නියත කරනු ලැබිය යුතු ය.

(10) මේ වගන්තිය යටතේ, ආඥාවක් කරනු ලබන්නේ කවර අන්තර්ජාල අතරමැදියකුට විරුද්ධව ද ඒ අන්තර්ජාල අතරමැදියා, මහෙස්ත්‍රාත්වරයා විසින් ආඥාවක් කරනු ලබන කාලසීමාව තුළ සහ එසේ ආඥාවක් කරනු ලබන ආකාරයට අනුව ඒ ආඥාවට අනුකූලව කටයුතු කිරීම පැහැර හරිනු ලබන අවස්ථාවක දී, ඒ තැනැත්තා රුපියල් මිලියන දහයක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

අගතියට පත් තැනැත්තා විසින් අනන්‍යතා තොරතුරු හෙළිදරව් කරන ලෙස ඉල්ලීම

**26.** (1) ව්‍යාජ මාර්ගගත ගිණුමක් හෝ බොට් යොදා ගනිමින්, යම් මාර්ගගත ස්ථානයක් යම් තහනම් ප්‍රකාශයක් සන්නිවේදනය කිරීම සඳහා යොදාගත් තැනැත්තකුගේ අනන්‍යතාවයට හෝ සිටින ස්ථානයට අදාළ යම් තොරතුරක් හෙළිදරව් කරන ලෙස විධාන කරමින් එකී මාර්ගගත ස්ථානයේ අන්තර්ජාල අතරමැදියා වෙත ආඥාවක් කරන ලෙස ඉල්ලා, තහනම් ප්‍රකාශයකින් අගතියට පත් තැනැත්තකු විසින්, ඒ අගතියට පත් තැනැත්තා වාසය කරන ප්‍රදේශයේ අධිකරණ බලය හිමි දිසා අධිකරණයේ පවරනු ලබන සිවිල් නඩු කටයුත්තක් ආකාරයෙන් ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ ඉල්ලීමක් ලැබුණු පසු, අධිකරණය විසින්-

(අ) ඒ ප්‍රකාශයෙන් අගතියට පත් තැනැත්තාට අනන්‍යතාවය සොයා ගත නොහැකි තැනැත්තකු විසින් එකී තහනම් ප්‍රකාශය සන්නිවේදනය කරනු ලැබ ඇත්නම්;

(ආ) ආඥාව ලබා ගැනීමට ඉල්ලා සිටින්නේ කවර අන්තර්ජාල අතරමැදියකුට විරුද්ධව ද ඒ අන්තර්ජාල අතරමැදියා, නිර්දෝෂීව හෝ එසේ නොමැතිව ඒ ප්‍රකාශය සන්නිවේදනය කිරීමට සම්බන්ධ වී ඇත්නම්;

(ඇ) ඒ ප්‍රකාශය සන්නිවේදනය වීම හේතුවෙන් ඇති වූ හානිය හෝ පීඩාව සඳහා සහනයක් ලබා ගැනීම සඳහා නීති කෘත්‍යයක් ආරම්භ කිරීමට, අගතියට පත් තැනැත්තාට ඒ සඳහා තොරතුරු සොයා ගැනීම අවශ්‍ය වන්නේ නම්; සහ

(ඈ) ඒ තොරතුරු හෙළිදරව් කර ගැනීමට අගතියට පත් තැනැත්තාට ඇති අයිතිය, හඳුනාගැනීමට උත්සාහ ගන්නා තැනැත්තාගේ යම් විරුද්ධ අයිතියක් හෝ හිමිකමක් ඉක්මවා යන්නේ නම්,

අගතියට පත් තැනැත්තා විසින් ඉල්ලා සිටිනු ලබන තොරතුරු හෙළිදරව් කරන ලෙස අන්තර්ජාල අතරමැදියකුට ආඥාවක් කරනු ලැබිය හැකි ය.

ඇතැම් තත්ත්වයන් තුළ දී අන්තර්ජාල සේවා සපයන්නන් වගකීමෙන් නිදහස් කිරීම

**27.** (1) වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට සහ (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව පහත සඳහන් සේවාවන් සැපයීමේ නිරතව සිටින යම් තැනැත්තකු, ඒ තැනැත්තා හිමිකාරීත්වය දරන, මෙහෙයවන හෝ පාලනය කරනු ලබන මාර්ගගත ස්ථානයකින් සන්නිවේදනය කරන ලද තහනම් ප්‍රකාශයක් සංසරණය වීම සම්බන්ධයෙන් හෝ මේ පනත යටතේ වරදක් වන යම් තහනම් ප්‍රකාශයක් අඩංගු වන සන්නිවේදන සබැඳියක් ඒ මාර්ගගත ස්ථානය හරහා අවසාන පරිශීලකයන් වෙත ලබා දීම සම්බන්ධයෙන් හෝ ඒ

සන්නිවේදනය මගින් යම් තැනැත්තකුට සිදු වූ යම් අයුතු හානියක් සඳහා ගෙවිය යුතු වන්දියක් සම්බන්ධයෙන් හෝ වගකීමකට යටත් නොවිය යුතු ය:-

(අ) අන්තර්ජාල අතරමැදි සේවාවක්;

(ආ) විදුලි සංදේශ සේවාවක්;

(ඇ) මහජනයාට අන්තර්ජාල ප්‍රවේශය ලබාදෙන සේවාවක්;

(ඈ) පරිගණක සම්පත් සේවාවක්;

(ඉ) යම් විද්‍යුත් තැපැල් පණිවුඩයක්, විද්‍යුත් තැපැල් සේවාවක් මගින් සක්‍රිය කරන ලද, පරිශීලකයා විසින් ජනනය කරනු ලැබූ අන්තර්ගතයක් සහිත විද්‍යුත් තැපැල් පණිවුඩයක් පමණක් වන්නේ නම්, එවැනි විද්‍යුත් තැපැල් සේවාවක්;

(ඊ) (i) යම් කෙටි පණිවුඩයක්, කෙටි පණිවුඩ සේවා සපයන්නකු මගින් සක්‍රිය කරන ලද, පරිශීලකයා විසින් ජනනය කරනු ලැබූ අන්තර්ගතයක් සහිත කෙටි පණිවුඩයක් පමණක් වන්නේ නම්, එවැනි කෙටි පණිවුඩ සේවාවක්;

(ii) යම් බහුමාධ්‍ය පණිවුඩයක්, බහුමාධ්‍ය පණිවුඩ සේවා සපයන්නකු මගින් සක්‍රිය කරන ලද, පරිශීලකයා විසින් ජනනය කරනු ලැබූ අන්තර්ගතයක් සහිත බහුමාධ්‍ය පණිවුඩයක් පමණක් වන්නේ නම්, එවැනි බහුමාධ්‍ය පණිවුඩ සේවාවක්; හෝ

(iii) යම් කෙටි පණිවුඩයක් හා බහුමාධ්‍ය පණිවුඩයක්, කෙටි පණිවුඩ හා බහුමාධ්‍ය පණිවුඩ සේවා සපයන්නකු මගින් සක්‍රිය කරන ලද, පරිශීලකයා විසින් ජනනය කරනු ලැබූ අන්තර්ගතයක් සහිත කෙටි පණිවුඩයක් හා බහුමාධ්‍ය පණිවුඩයක් පමණක් වන්නේ නම්,

එවැනි කෙටි පණිවුඩ හා බහුමාධ්‍ය පණිවුඩ සේවාවක්; හෝ

(උ) යම් එකිනෙකට වූ සජීවී ශ්‍රව්‍ය සන්නිවේදනයක්, සජීවී ශ්‍රව්‍ය සන්නිවේදන සේවා සපයන්නකු මගින් සක්‍රිය කරන ලද, පරිශීලකයා විසින් ජනනය කරනු ලැබූ අන්තර්ගතයක් සහිත සජීවී ශ්‍රව්‍ය සන්නිවේදනයක් පමණක් වන්නේ නම්, එවැනි සජීවී ශ්‍රව්‍ය සන්නිවේදන සේවාවක්.

(2) (අ) (1) වන උපවගන්තියේ සඳහන් කරන ලද යම් සේවාවක් මගින් සන්නිවේදනය කරන ලද අසත්‍ය ප්‍රකාශයක්, තහනම් ප්‍රකාශයක් හෝ යම් දෙයක්, මේ පනත ක්‍රියාත්මක වන දිනයේ සිට මාස හයක් ඇතුළත ඉවත් කරනු ලැබ ඇති අවස්ථාවක දී; හෝ

(ආ) තුන්වන පාර්ශ්වයන් විසින් යම් දෙයක් උඩුගත කරනු ලැබ ඇති හෝ යම් දෙයකට මැදිහත් වනු ලැබ ඇති අවස්ථාවක දී,

මාර්ගගත ගිණුමක හිමිකරුවකු හෝ අන්තර්ජාල සේවා සපයන්නකු, (අ) ඡේදයේ හෝ (ආ) ඡේදයේ සඳහන් කරන ලද ප්‍රකාශය හෝ දෙය සම්බන්ධයෙන් වගකීමකට යටත් නොවිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ ලබාදෙනු ලබන වගකීමෙන් නිදහස් කිරීම, ඒ තැනැත්තා විසින්-

(අ) සන්නිවේදනය ආරම්භ කරන ලද්දේ නම්;

(ආ) සන්නිවේදනයෙහි අවසාන පරිශීලකයා තෝරා ගනු ලැබ ඇත්නම්;

(ඇ) සන්නිවේදනයෙහි අන්තර්ගතය තෝරා ගනු ලැබ ඇත්නම් හෝ වෙනස් කරනු ලැබ ඇත්නම්; හෝ

(ඈ) සේවාව ලබා දීමේ දී මේ පනතේ විධිවිධානවලට හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයකට හෝ රීතියකට හෝ මේ පනත යටතේ සාදන ලද රීති ආකාරයෙන් කොමිෂන් සභාව මගින් නිකුත් කරනු ලබන යම් චර්යා සංග්‍රහයකට අනුකූල වී නොමැති නම්,

අදාළ නොවිය යුතු ය.

(4) මේ පනත යටතේ සාදන රීති ආකාරයෙන් කොමිෂන් සභාව මගින් නිකුත් කරනු ලබන අදාළ චර්යා සංග්‍රහයට අනුකූලව කටයුතු කිරීම පැහැර හරිනු ලබන සහ එමගින් වෙනත් යම් තැනැත්තකුට අයුතු අලාභයක් සිදු කරනු ලබන යම් තැනැත්තකු අලාභය සිදු වූ තැනැත්තාට වන්දි ආකාරයෙන් අලාභ ගෙවීමට යටත් විය යුතු ය.

(5) මේ වගන්තියේ කාර්යය සඳහා-

"පරිගණක සම්පත් සේවාව" යන්නට, අන්තර්ජාල අතරමැදි සේවාවක්, විදුලි සංදේශ සේවාවක් හෝ අන්තර්ජාලයට මහජන ප්‍රවේශය ලබාදෙන සේවාවක් භාවිත කිරීමෙන් හැර වෙනත් ඕනෑම ආකාරයකින් තැනැත්තකු විසින් සපයනු ලබන අන්තර්ජාල සේවාවක් ඇතුළත් වේ;

"විදුලි සංදේශ සේවාව" යන්නට, 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ ඒ යෙදුමට දී ඇති අර්ථය ම තිබිය යුතු ය.

## V වන කොටස

### ප්‍රකාශයට පත් කරන ලද මාර්ගගත ස්ථාන

**28.** (1) කොමිෂන් සභාව විසින්- ප්‍රකාශයට පත් කරන ලද මාර්ගගත ස්ථාන

(අ) 24 වන වගන්තිය යටතේ මහෙස්ත්‍රාත්වරයා විසින් කොන්දේසි සහිත ආඥා නියත කරනු ලැබූ ඒ මාර්ගගත ස්ථානයෙහි එකිනෙකට වෙනස් තහනම් ප්‍රකාශ තුනක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් ශ්‍රී ලංකාව තුළ සිටින අවසාන පරිශීලකයන් වෙත සන්නිවේදනය වී ඇත්නම්; සහ

(ආ) මේ වගන්තිය යටතේ වූ ප්‍රකාශයක් කරනු ලබන දිනට පෙරාතුව වූ මාස හයක් තුළ, යටත් පිරිසෙයින්, එවැනි ප්‍රකාශ තුනක්වත්, ශ්‍රී ලංකාව තුළ සිටින අවසාන පරිශීලකයන් වෙත ඒ මාර්ගගත ස්ථානයෙහි පළමුව සන්නිවේදනය වී ඇත්නම්,

යම් මාර්ගගත ස්ථානයක් "ප්‍රකාශයට පත් කරන ලද මාර්ගගත ස්ථානයක්" ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ කාර්ය සඳහා, යම් ප්‍රකාශයක් වැදගත් කරුණක් සම්බන්ධයෙන් අනෙකුත් ප්‍රකාශයකින් වෙනස් වේ නම්, එවැනි යම් ප්‍රකාශයක් අනෙක් ප්‍රකාශයෙන් වෙනස් වේ.

(3) මේ වගන්තිය යටතේ කරනු ලබන ප්‍රකාශයක-

(අ) මාර්ගගත ස්ථානයේ යූ.ආර්.එල්. වසම් නාමය හෝ ඊට අනන්‍ය වූ වෙනත් යම් හඳුනාගැනීමක්;

(ආ) මහෙස්ත්‍රාත් අධිකරණය විසින් කරන ලද අදාළ ආඥාවන්;

(ඇ) ඒ ප්‍රකාශයට පත් කිරීම බලාත්මක වන දිනය;

(ඈ) (ඇ) ඡේදයේ සඳහන් දිනයෙන් වසර දෙකකට වඩා පසු නොවන දිනයක් විය යුතු, ඒ ප්‍රකාශයට පත් කිරීමේ කාලය ඉකුත් වන දිනය;

(ඉ) ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සිටින ඒ මාර්ගගත ස්ථානයේ හිමිකරු හෝ මෙහෙයුම්කරු සඳහා, ඒ මාර්ගගත ස්ථානය ප්‍රකාශයට පත් කිරීමක විෂය කරුණක් වන බවට වන දැන්වීමක්, ඒ ප්‍රකාශයට පත් කිරීමෙහි නිශ්චිතව දක්වනු ලැබිය හැකි ආකෘතියකට අනුව ඒ මාර්ගගත ස්ථානය වෙත ප්‍රවේශ වන ශ්‍රී ලංකාව තුළ සිටින යම් අවසාන පරිශීලකයකු වෙත, ඒ ප්‍රකාශයට පත් කිරීමෙහි නිශ්චිතව දක්වනු ලැබිය හැකි ආකාරයකට අනුව සන්නිවේදනය කරන ලෙසට වන දැන්වීමක්; සහ

(ඊ) නියම කරනු ලැබිය හැකි වෙනත් යම් තොරතුරු,

අන්තර්ගත විය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ කරනු ලබන ප්‍රකාශයට පත් කිරීමක කාලය-

(අ) (3) වන උපවගන්තියේ (ඇ) ඡේදයට අනුකූලව එහි නිශ්චිතව දැක්වෙන දිනය; හෝ

(ආ) කොමිෂන් සභාව විසින් එය අවලංගු කරනු ලබන දිනය හෝ ඉවත් කරනු ලබන දිනය,

යන දිනයන්ගෙන් කලින් එළඹෙන කවර හෝ දිනයක ඉකුත් විය හැකි ය.

(5) ප්‍රකාශයට පත් කිරීමක් සිදු කිරීමෙන් පසුව සහ එය බලාත්මක වන දිනට පෙරාතුව, හැකිතාක් ඉක්මණින්, කොමිෂන් සභාව විසින් නියම කරනු ලැබිය හැකි ආකෘතියට සහ ආකාරයට අනුව-

(අ) මේ වගන්තිය යටතේ ප්‍රකාශයට පත් කිරීමක් නිකුත් කර ඇති බව දක්වමින්; සහ

(ආ) ප්‍රකාශයට පත් කිරීම අදාළ වන මාර්ගගත ස්ථානයේ යූ.ආර්.එල්. වසම් නාමය හෝ ඊට අනන්‍ය වූ වෙනත් යම් හඳුනාගැනීමක් දක්වමින්,

ගැසට් පත්‍රයේ දැන්වීමක් පළ කරනු ලැබිය යුතු ය.

(6) (අ) ඒ ප්‍රකාශයට පත් කිරීම පුද්ගලිකව භාර දෙනු ලැබුවහොත් හෝ ඒ මාර්ගගත ස්ථානයේ හිමිකරු හෝ මෙහෙයුම්කරු අවසන් වරට සිටි බවට සැලකෙන ලිපිනයට තැපැල් මාර්ගයෙන් යවනු ලැබුවහොත් හෝ ඉලෙක්ට්‍රොනික මාර්ගයෙන් ඒ තැනැත්තා වෙත භාරදෙනු ලැබුවහොත් හෝ නඩුවේ ස්වභාවය මත පදනම්ව කොමිෂන් සභාව විසින් යොදා ගනු ලැබිය හැකි වෙනත් උචිත ක්‍රමයක් මගින් භාරදෙනු ලැබුවහොත් හෝ ඒ ප්‍රකාශයට පත් කිරීම භාරදෙනු ලැබූ බවට සළකනු ලැබිය යුතු ය.

(ආ) ඒ තහනම් ප්‍රකාශය සන්නිවේදනය කරන ලද්දේ කවර මාර්ගගත ස්ථානයක් මගින් ද ඒ මාර්ගගත ස්ථානයේ හිමිකරු හෝ මෙහෙයුම්කරුගේ විද්‍යුත් තැපැල් ලිපිනය වෙත හෝ සමාජ මාධ්‍ය ගිණුම වෙත ඒ ප්‍රකාශය යවනු ලැබුවහොත්, ඒ ප්‍රකාශය ඉලෙක්ට්‍රොනික මාර්ගයෙන් භාරදෙනු ලැබූ බවට සලකනු ලැබිය යුතු ය.

(7) (3) වන උපවගන්තියේ (ඉ) ඡේදයේ සඳහන් පරිදි දැන්වීමක් සන්නිවේදනය කරන ලෙසට වූ දැන්වීමකට අනුකූලව කටයුතු කිරීමට ප්‍රකාශයට පත් කරන ලද මාර්ගගත ස්ථානයක හිමිකරු හෝ මෙහෙයුම්කරු අපොහොසත් වන අවස්ථාවක දී, කොමිෂන් සභාව හෝ කොමිෂන් සභාව විසින් බලය පවරනු ලැබූ යම් තැනැත්තකු විසින්-

(අ) ශ්‍රී ලංකාව තුළ සිටින අවසාන පරිශීලකයන් විසින් ඒ ප්‍රකාශයට පත් කරන ලද මාර්ගගත ස්ථානය වෙත ප්‍රවේශ වීම අක්‍රිය කරන ලෙස;

(ආ) ඒ ප්‍රකාශයට පත් කරන ලද මාර්ගගත ස්ථානයට ප්‍රවේශ වන ශ්‍රී ලංකාව තුළ සිටින සියලු අවසාන පරිශීලකයන් වෙත, ඒ මාර්ගගත ස්ථානය, ප්‍රකාශයට පත් කිරීමක විෂය කරුණ වන බවට ප්‍රකාශය කරමින්, දැන්වීමක් සන්නිවේදනය කරන ලෙස; සහ

(ඇ) මහෙස්ත්‍රාත්වරයා විසින් සුදුසු යයි සලකනු ලබන වෙනත් යම් ආඥාවක් කරන ලෙස,

ඒ හිමිකරුට හෝ මෙහෙයුම්කරුට විධාන කරමින් ආඥාවක් කරන ලෙස මහෙස්ත්‍රාත්වරයා වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(8) ඒ ඉල්ලීම පිළිබඳ සලකා බැලීමෙන් පසු, මහෙස්ත්‍රාත්වරයා විසින්, (7) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් ඉල්ලා සිටිනු ලබන විධාන අන්තර්ගත වන්නා වූ කොන්දේසි සහිත ආඥාවක්, ප්‍රකාශයට පත් කරන ලද මාර්ගගත ස්ථානයක හිමිකරු හෝ මෙහෙයුම්කරු වෙත කරනු ලැබිය හැකි ය.

(9) (8) වන උපවගන්තිය යටතේ කරනු ලබන ආඥාවේ, වෙනත් කරුණු අතර-

(අ) ශ්‍රී ලංකාව තුළ සිටින අවසාන පරිශීලකයන් විසින් ඒ ප්‍රකාශයට පත් කරන ලද මාර්ගගත ස්ථානය වෙත ප්‍රවේශ වීම අක්‍රිය කළ යුතු වන්නේ කවර ප්‍රකාශයට පත් කරන

ලද මාර්ගගත ස්ථානයක හිමිකරු හෝ මෙහෙයුම්කරු විසින් ද ඒ හිමිකරුගේ හෝ මෙහෙයුම්කරුගේ නම;

(ආ) (3) වන උපවගන්තියේ (ඉ) ඡේදයේ සඳහන් දැන්වීම සන්නිවේදනය කරනු ලැබිය යුතු ආකාරය; සහ

(ඇ) ආඥාව භාරදුන් පසු ඒ දැන්වීම පළ කරනු ලැබිය යුතු කාලසීමාව,

අන්තර්ගත විය හැකි ය.

(10) (8) වන උපවගන්තිය යටතේ කරනු ලබන ආඥාව, පුද්ගලිකව භාරදෙනු ලැබුවහොත් හෝ ඒ තැනැත්තා අවසන් වරට සිටි බවට සැලකෙන ලිපිනයට ලියාපදිංචි තැපැල් මාර්ගයෙන් යවනු ලැබුවහොත් හෝ ඉලෙක්ට්‍රොනික මාර්ගයෙන් ඒ තැනැත්තා වෙත භාරදෙනු ලැබුවහොත් හෝ නඩුවේ ස්වභාවය මත පදනම්ව මහෙස්ත්‍රාත්වරයා විසින් සුදුසු යයි සලකන වෙනත් යම් ක්‍රමයක් මගින් භාරදෙනු ලැබුවහොත්, ඒ ආඥාව කරනු ලබන්නේ කවර ප්‍රකාශයට පත් කරන ලද මාර්ගගත ස්ථානයක හිමිකරුවකුට හෝ මෙහෙයුම්කරුවකුට විරුද්ධව ද, ඒ හිමිකරු හෝ මෙහෙයුම්කරු වෙත භාරදෙනු ලැබූ බවට සලකනු ලැබිය යුතු ය.

(11) (8) වන උපවගන්තිය යටතේ කොන්දේසි සහිත ආඥාවක් කරනු ලැබ ඇත්තේ කවර ප්‍රකාශයට පත්කරන ලද මාර්ගගත ස්ථානයක හිමිකරුට හෝ මෙහෙයුම්කරුවකුට විරුද්ධව ද, ඒ හිමිකරු හෝ මෙහෙයුම්කරු විසින්, ඒ ආඥාවට අනුකූලව කටයුතු කිරීම හෝ (12) වන උපවගන්තියේ නිශ්චිතව දැක්වෙන පරිදි ඒ ආඥාව නියත කරනු නොලැබිය යුත්තේ මන්ද යන්න සම්බන්ධයෙන් හේතු දැක්වීම සඳහා හෝ මහෙස්ත්‍රාත්වරයා ඉදිරියෙහි පෙනී සිටීම හෝ කරනු ලැබිය යුතු ය.

(12) (8) වන උපවගන්තිය යටතේ කොන්දේසි සහිත ආඥාවක් කරනු ලැබ ඇත්තේ කවර ප්‍රකාශයට පත් කරන ලද මාර්ගගත ස්ථානයක හිමිකරුට හෝ මෙහෙයුම්කරුට විරුද්ධව ද, ඒ හිමිකරු හෝ මෙහෙයුම්කරු විසින් හේතු දැක්වීමට අදහස් කරනු ලබන අවස්ථාවක දී, ඒ තැනැත්තා විසින්, ඒ ආඥාව කරනු ලබන දින සිට සති දෙකක කාලසීමාවක් ඇතුළත ඒ ආඥාව කරනු ලබන මහෙස්ත්‍රාත්වරයා ඉදිරියෙහි පෙනී සිටිනු ලැබිය යුතු අතර, මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති ආකාරයට අනුව ඒ ආඥාව ඉවත් කරන ලෙස හෝ වෙනස් කරන ලෙස හෝ ඉල්ලා සිටිනු ලැබිය යුතු ය:

එසේ වුවද, (8) වන උපවගන්තිය යටතේ කොන්දේසි සහිත ආඥාවක් කරනු ලැබ ඇත්තේ කවර ප්‍රකාශයට පත් කරන ලද මාර්ගගත ස්ථානයක හිමිකරුට හෝ මෙහෙයුම්කරුට විරුද්ධව ද ඒ හිමිකරු හෝ මෙහෙයුම්කරු විසින්, මේ වගන්තියේ විධිවිධාන ප්‍රකාර අධිකරණය විසින් ඒ ආඥාව ඉවත් කරනු ලබන හෝ වෙනස් කරනු ලබන තෙක්, ඒ ආඥාව කරනු ලබන දින සිට බලාත්මක වන පරිදි ඒ ආඥාවට අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටින්නේ ය.

(13) (8) වන උපවගන්තිය යටතේ ආඥාවක් කරනු ලැබ ඇත්තේ කවර ප්‍රකාශයට පත් කරන ලද මාර්ගගත ස්ථානයක හිමිකරුට හෝ මෙහෙයුම්කරුට විරුද්ධව ද ඒ හිමිකරු හෝ මෙහෙයුම්කරු විසින්, ඒ ආඥාවට අනුකූලව කටයුතු නොකරන්නේ නම් හෝ (12) වන උපවගන්තිය යටතේ මහෙස්ත්‍රාත්වරයා ඉදිරියෙහි පෙනී නොසිටින්නේ නම්, ඒ තැනැත්තා (15) වන උපවගන්තියේ නිශ්චිතව දැක්වෙන දණ්ඩනයට යටත් විය යුතු අතර ඒ ආඥාව නියත කරනු ලැබිය යුතු ය.

(14) (අ) ඒ ප්‍රකාශයට පත් කරන ලද මාර්ගගත ස්ථානයේ හිමිකරු හෝ මෙහෙයුම්කරු, (12) වන උපවගන්තිය ප්‍රකාර පෙත්සමක් සහ දිවුරුම් ප්‍රකාශයක් මගින් හේතු දැක්වීම සඳහා මහෙස්ත්‍රාත්වරයා ඉදිරියෙහි පෙනී සිටිනු ලබන අවස්ථාවක දී, මහෙස්ත්‍රාත්වරයා විසින්, පරීක්ෂණයක් පවත්වනු ලැබිය යුතු අතර ඒ පරීක්ෂණය, එය ආරම්භ කරනු ලබන දින සිට සති දෙකක් ඇතුළත අවසන් කරනු ලැබිය යුතු ය.

(ආ) (8) වන උපවගන්තිය යටතේ කොන්දේසි සහිත ආඥාවක් කරනු ලැබ ඇත්තේ කවර ප්‍රකාශයට පත් කරන ලද මාර්ගගත ස්ථානයක හිමිකරුට හෝ මෙහෙයුම්කරුට විරුද්ධව ද, ඒ හිමිකරු හෝ මෙහෙයුම්කරු විසින් ප්‍රකාශ කරනු ලබන කරුණු සැලකිල්ලට ගනිමින්, මේ වගන්තිය යටතේ වන ආඥාව සාධාරණ නොවන බවට සහ සුදුසු නොවන බවට මහෙස්ත්‍රාත්වරයා සෑහීමට පත් වුවහොත්, ඒ මහෙස්ත්‍රාත්වරයා විසින්, ඒ ආඥාව ඉවත් කිරීම හෝ වෙනස් කිරීම කරනු ලැබිය හැකි අතර මේ පනතේ විධිවිධානවලට යටත්ව උචිත ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(ඇ) මහෙස්ත්‍රාත්වරයා එසේ සෑහීමට පත්නොවුවහොත්, (8) වන උපවගන්තිය යටතේ කරනු ලැබ ඇති ආඥාව නියත කරනු ලැබිය යුතු ය.

(ඈ) (8) වන උපවගන්තිය යටතේ කරනු ලැබ ඇති ආඥාව, (ආ) ඡේදය යටතේ වෙනස් කරනු ලබන අවස්ථාවක දී, ඒ ආඥාව නියත කරනු ලැබිය යුතු ය.

(15) මේ වගන්තිය යටතේ ආඥාවක් කරනු ලබන්නේ කවර මාර්ගගත ස්ථානයක හිමිකරුවකුට හෝ මෙහෙයුම්කරුවකුට විරුද්ධව ද, ඒ හිමිකරු හෝ මෙයෙහුම්කරු විසින් ආඥාවෙහි සඳහන් කරනු ලබන කාලසීමාව ඇතුළත සහ ආඥාවෙහි සඳහන් කරනු ලබන ආකාරයකට අනුව ඒ ආඥාවට අනුකූලව කටයුතු කිරීමට පැහැර හරිනු ලබන අවස්ථාවක දී, ඒ ප්‍රකාශයට පත් කරන ලද මාර්ගගත ස්ථානයේ හිමිකරු හෝ මෙහෙයුම්කරු වරදක් සිදු කරනු ලබන අතර, වරදකරු කරනු ලැබූ විට වසර හයක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් මිලියන දහයක් නොඉක්මවන දඩයකට හෝ යටත් විය යුතු අතර, මහෙස්ත්‍රාත් අධිකරණය විසින්, ඒ ප්‍රකාශයට පත් කරන ලද මාර්ගගත ස්ථානය වෙත ශ්‍රී ලංකාව තුළ සිටින අවසාන පරිශීලකයන් විසින් ප්‍රවේශ වීම අක්‍රිය කිරීම සඳහා පියවර ගන්නා ලෙස කොමිෂන් සභාවට විධාන කරමින් ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(16) කොමිෂන් සභාව විසින්, ඕනෑම අවස්ථාවක දී-

(අ) ස්වකීය මූල පිරීම මත; හෝ

(ආ) (i) ප්‍රකාශයට පත් කරන ලද මාර්ගගත ස්ථානයේ හිමිකරු හෝ මෙහෙයුම්කරු විසින්; හෝ

(ii) ප්‍රකාශයට පත් කරන ලද මාර්ගගත ස්ථානය සම්බන්ධයෙන් කර්තෘත්ව පාලනය සහිත යම් තැනැත්තකු විසින්,

කරනු ලබන ඉල්ලීමක් මත,

කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් කාලසීමාවක් සඳහා (1) වන උපවගන්තිය යටතේ කරනු ලබන ප්‍රකාශයට පත් කිරීමක් අත්හිටුවීම, වෙනස් කිරීම හෝ අවලංගු කිරීම කරනු ලැබිය හැකි ය.

(17) (16) වන උපවගන්තියේ කාර්යය සඳහා, යම් තැනැත්තකුට-

(අ) මාර්ගගත ස්ථානයට යම් ප්‍රකාශයක් ඇතුළත් කරනු ලැබිය හැකි ද යන්න හෝ මාර්ගගත ස්ථානයෙන් යම් ප්‍රකාශයක් බැහැර කරනු ලැබිය හැකි ද යන්න; හෝ

(ආ) යම් ප්‍රකාශයක් ස්ථානගත කරනු ලැබිය යුත්තේ මාර්ගගත ස්ථානයේ කවර ස්ථානයකට ද යන්න,

පිළිබඳ තීරණය කරනු ලැබීමේ හැකියාව ඇත්නම්, ඒ තැනැත්තාට "මාර්ගගත ස්ථානය සම්බන්ධයෙන් කර්තෘත්ව පාලනයක්" තිබේ.

(18) (16) වන උපවගන්තිය යටතේ ප්‍රකාශයක් අත්හිටුවීම, වෙනස් කිරීම හෝ අවලංගු කිරීම කරනු ලැබූ පසු, කොමිෂන් සභාව විසින්-

(අ) නියම කරනු ලැබිය හැකි යම් ආකෘතියකට සහ ආකාරයකට අනුව, ඒ අත්හිටුවීම, වෙනස් කිරීම හෝ අවලංගු කිරීම පිළිබඳ දැන්වීමක් ගැසට් පත්‍රයේ පළ කිරීම; සහ

(ආ) ප්‍රකාශයට පත් කරන ලද මාර්ගගත ස්ථානයේ හිමිකරුට හෝ මෙහෙයුම්කරුට ඒ දැන්වීමේ පිටපතක් ලබාදීම සඳහා සාධාරණ ප්‍රයත්න දැරීම,

කරනු ලැබිය යුතු ය.

ඇතැම් තැනැත්තන් විසින්, ශ්‍රී ලංකාව තුළ දී ගෙවීමක් කරනු ලබන අන්තර්ගතයන්, ප්‍රකාශයට පත් කරන ලද මාර්ගගත ස්ථානවල සන්නිවේදනය නොකළ යුතු බව ආදිය

**29.** (1) අන්තර්ජාල සේවා සපයන්නකු විසින්, 28 වන වගන්තිය යටතේ කරනු ලබන ප්‍රකාශයට පත් කිරීමක් බලාත්මක වන දිනයෙන් ආරම්භ වන නියම කරන ලද කාලසීමාවකින් පසු, ප්‍රකාශයට පත් කරන ලද මාර්ගගත ස්ථානයකට ඇතුළත් කරනු ලබන හෝ ඇතුළත් කිරීමට කටයුතු සලස්වනු ලබන යම් ගෙවීමක් කරනු ලබන අන්තර්ගතයක්, ශ්‍රී ලංකාව තුළ දී, ප්‍රකාශයට පත් කරන ලද මාර්ගගත ස්ථානයෙහි සන්නිවේදනය කරනු නොලබන බවට වගබලා ගැනීම සඳහා (ශ්‍රී ලංකාව තුළ සහ ශ්‍රී ලංකාවෙන් පිටත යන ස්ථාන දෙකෙහි දී ම) සාධාරණ පියවර ගනු ලැබිය යුතු ය.

(2) අන්තර්ජාල අතරමැදියකු විසින්, 28 වන වගන්තිය යටතේ කරනු ලබන ප්‍රකාශයට පත් කිරීමක් බලාත්මක වන දිනයෙන් ආරම්භ වන නියම කරන ලද කාලසීමාවකින් පසු, ප්‍රකාශයට පත් කරන ලද මාර්ගගත ස්ථානයකට ඇතුළත් කරනු ලබන හෝ ඇතුළත් කිරීමට කටයුතු සලස්වනු ලබන, යම් ගෙවීමක් කරනු ලබන අන්තර්ගතයක් ශ්‍රී ලංකාව තුළ දී, ප්‍රකාශයට පත් කරන ලද මාර්ගගත ස්ථානයෙහි සන්නිවේදනය කරනු නොලබන බවට වගබලා ගැනීම සඳහා (ශ්‍රී ලංකාව තුළ සහ ශ්‍රී ලංකාවෙන් පිටත යන ස්ථාන දෙකෙහි දී ම) සාධාරණ පියවර ගනු ලැබිය යුතු ය.

(3) අන්තර්ජාල අතරමැදියකු විසින්, 28 වන වගන්තිය යටතේ කරනු ලබන ප්‍රකාශයට පත් කිරීමක් බලාත්මක වන දිනයෙන් ආරම්භ වන නියම කරන ලද කාලසීමාවකින් පසු, අන්තර්ජාල අතරමැදියකු ලෙස කටයුතු කිරීමේ දී, ප්‍රකාශයට පත් කරන ලද මාර්ගගත ස්ථානයකට ප්‍රසිද්ධිය ලබා දෙන්නා වූ හෝ ප්‍රකාශයට පත් කරන ලද මාර්ගගත ස්ථානයක් අන්‍යාකාරයකින් ප්‍රවර්ධනය කරන්නා වූ යම් ගෙවීමක් කරනු ලබන අන්තර්ගතයක් ශ්‍රී ලංකාව තුළ සන්නිවේදනය කිරීම සඳහා පහසුකම් සලසනු නොලබන බවට වගබලා ගැනීම සඳහා (ශ්‍රී ලංකාව තුළ සහ ශ්‍රී ලංකාවෙන් පිටත යන ස්ථාන දෙකෙහි දී ම) සාධාරණ පියවර ගනු ලැබිය යුතු ය.

(4) අන්තර්ජාල සේවා සපයන්නකු හෝ අන්තර්ජාල අතරමැදියකු විසින්, නියම කරනු ලැබිය හැකි පරිදි වූ එවැනි පියවර ගෙන ඇත්නම්, අවස්ථාවෝචිත පරිදි, (1) වන හෝ (2) වන උපවගන්තිවල කාර්ය සඳහා, එවැනි යම් අන්තර්ජාල සේවා සපයන්නකු හෝ අන්තර්ජාල අතරමැදියකු, ප්‍රකාශයට පත් කරන ලද මාර්ගගත ස්ථානයට ඇතුළත් කරනු ලබන හෝ ඇතුළත් කිරීමට කටයුතු සලස්වනු ලබන යම් ගෙවීමක් කරනු ලබන අන්තර්ගතයක් ශ්‍රී ලංකාව තුළ දී ඒ ප්‍රකාශයට පත් කරන ලද මාර්ගගත ස්ථානයෙහි සන්නිවේදනය කරනු නොලබන බවට වගබලා ගැනීම සඳහා සාධාරණ පියවර ගෙන ඇති බවට සලකනු ලැබිය යුතු ය.

(5) අන්තර්ජාල අතරමැදියකු විසින් නියම කරනු ලැබිය හැකි පරිදි වූ එවැනි යම් පියවර ගෙන ඇත්නම්, (3) වන උපවගන්තියේ කාර්ය සඳහා ඒ උපවගන්තියේ සඳහන් කර ඇති ලෙස යම් ගෙවීමක් කරනු ලබන අන්තර්ගතයක් ශ්‍රී ලංකාව තුළ දී සන්නිවේදනය කිරීම සඳහා පහසුකම් සලසනු නොලබන බවට වගබලා ගැනීම සඳහා සාධාරණ පියවර ගෙන ඇති බවට සලකනු ලැබිය යුතු ය.

(6) (1) වන, (2) වන හෝ (3) වන උපවගන්තිවල විධිවිධාන වලට අනුකූලව කටයුතු කිරීම පැහැර හරින තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර, වරදකරු කරනු ලැබූ විට වසර හතක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් මිලියන දහයක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු අතර, දෙවන වර හෝ තදනන්තරව වරදකරු කරනු ලැබූ විට ඒ බන්ධනාගාරගත කිරීමේ කාලය හෝ දඩය හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙක ම හෝ දෙගුණයක් කරනු ලැබිය හැකි ය.

ප්‍රකාශයට පත් කරන ලද මාර්ගගත ස්ථානයක් ක්‍රියාත්මක කිරීමෙන් ප්‍රතිලාභ ලබා ගැනීම පිළිබඳ තහනම

**30.** (1) ශ්‍රී ලංකාව තුළ දී හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සිටින යම් තැනැත්තකු විසින්, යම් ප්‍රකාශයට පත් කරන ලද මාර්ගගත ස්ථානයක් ක්‍රියාත්මක කිරීම සඳහා වන පෙලඹවීමක් ලෙස හෝ ත්‍යාගයක් ලෙස යම් මූල්‍යමය හෝ වෙනත් ද්‍රව්‍යමය ප්‍රතිලාභයක් ඉල්ලා සිටින, ලබාගන්නා හෝ ලබාගැනීමට එකඟ වන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර, වරදකරු කරනු ලැබූ විට වසර පහක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් මිලියන පහක් නොඉක්මවන දඩයකට හෝ යටත් විය යුතු අතර, දෙවන වර හෝ තදනන්තරව වරදකරු කරනු ලැබූ විට ඒ බන්ධනාගාරගත කිරීමේ කාලය හෝ දඩය හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙක ම හෝ දෙගුණයක් කරනු ලැබිය හැකි ය.

(2) අධිකරණයක් විසින්, යම් තැනැත්තකු මේ වගන්තිය යටතේ වන වරදකට වරදකරු කරනු ලබන අවස්ථාවක දී, එකී අධිකරණය විසින් (1) වන උපවගන්තියේ සඳහන් දඬුවම ඒ තැනැත්තාට නියම කිරීමට අමතරව, මේ වගන්තිය යටතේ වන වරදක් සිදු කිරීම මගින් අත්පත්කර ගන්නා ලද යම් වත්කම් අහිමි කරන ලෙස ද ආඥාවක් කරනු ලැබිය යුතු ය.

ප්‍රකාශයට පත් කරන ලද මාර්ගගත ස්ථානවලට මූල්‍යමය ආධාර සැපයීම පිළිබඳ තහනම

**31.** (1) යම් දේපළක් වියදම් කිරීම හෝ යොදා ගැනීම මගින් ශ්‍රී ලංකාව තුළ සිටින අවසාන පරිශීලකයන් හට යම් ප්‍රකාශයට පත් කරන ලද මාර්ගගත ස්ථානයක, තහනම් ප්‍රකාශ සන්නිවේදනය කිරීමට ආධාර කරන බව, උපකාරී වන බව හෝ එය ප්‍රවර්ධනය කරන බව දැන දැනම හෝ ඒ බවට විශ්වාස කිරීමට හේතු ඇතිව එවැනි යම් දේපළක් වියදම් කිරීම හෝ යොදා ගැනීම කරනු ලබන ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සිටින යම් තැනැත්තකු වරදක් සිදු කරන අතර, වරදකරු කරනු ලැබූ විට වසර පහක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් මිලියන පහක් නොඉක්මවන දඩයකට හෝ යටත් විය යුතු අතර, දෙවන වර හෝ තදනන්තරව වරදකරු කරනු ලැබූ විට ඒ බන්ධනාගාරගත කිරීමේ කාලය හෝ දඩය හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙක ම හෝ දෙගුණයක් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන, යම් මාර්ගගත ස්ථානයක යම් ගෙවීමක් කරනු ලබන අන්තර්ගතයක් සන්නිවේදනය කිරීමේ කාර්යය සඳහා යම් ප්‍රතිෂ්ඨාවක් ලබා දෙන අන්තර්ජාල සේවා සපයන්නකුට හෝ අන්තර්ජාල අතරමැදියකුට අදාළ නොවිය යුතු ය.

(3) අධිකරණයක් විසින් යම් තැනැත්තකු මේ වගන්තිය යටතේ වන වරදකට වරදකරු කරනු ලබන අවස්ථාවක දී, එකී අධිකරණය විසින්, (1) වන උපවගන්තියේ සඳහන් දඬුවම ඒ තැනැත්තාට නියම කිරීමට අමතරව, මේ වගන්තිය යටතේ වන වරදක් සිදු කිරීමෙන් ලබාගත් යම් දේපළක් වියදම් කිරීම හෝ යොදා ගැනීම මගින් අත්පත් කරගන්නා ලද යම් දේපළක් අහිමි කරන ලෙස ද ආඥාවක් කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ කාර්යය සඳහා "දේපළ" යන්නෙන්, මුදල් සහ නඩු කටයුතුවලට යටත්ව අයිතිය කියන දෑ සහ අනෙකුත් අස්පර්ශනීය හෝ අද්‍රව්‍යවත් දේපළ ඇතුළු අනෙකුත් සියලු චංචල හෝ නිශ්චල දේපළ අදහස් වේ.

VI වන කොටස

## ව්‍යාජ මාර්ගගත ගිණුම් සහ සමායෝජිත ව්‍යාජ හැසිරීම් නැවැත්වීම

**32.** (1) (2) වන උපවගන්තියේ කොන්දේසි සපුරා ඇත්නම්, කොමිෂන් සභාව විසින්, එකී දැන්වීමේ නිශ්චිතව දක්වනු ලබන කාලසීමාව සඳහා, පහත දැක්වෙන එක් කටයුත්තක් හෝ කටයුතු දෙක ම හෝ කරන ලෙස නියම කරමින් අන්තර්ජාල අතරමැදියකු වෙත ලිඛිතව දැන්වීමක් නිකුත් කරනු ලැබිය හැකි ය:- ව්‍යාජ මාර්ගගත ගිණුම් සහ සමායෝජිත ව්‍යාජ හැසිරීම් නැවැත්වීම

(අ) නිශ්චිතව දක්වනු ලබන මාර්ගගත ගිණුම් එකක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් මගින් ශ්‍රී ලංකාව තුළ යම් තහනම් ප්‍රකාශයක් සන්නිවේදනය කිරීම සඳහා එහි සේවාවන් භාවිත කිරීමට අවසර දීමෙන් වැළකීම; හෝ

(ආ) යම් තැනැත්තකු විසින් නිශ්චිතව දක්වනු ලබන මාර්ගගත ගිණුම් එකක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් භාවිත කිරීමෙන් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන එහි අන්තර්ජාල අතරමැදි සේවාවේ යම් අවසාන පරිශීලකයකු සමග අන්‍යොන්‍යව ක්‍රියා කිරීමට අවසර ලබා දීමෙන් වැළකීම.

(2) (1) වන උපවගන්තියේ සඳහන් කොන්දේසි පහත දැක්වෙන පරිදි විය යුතු ය:-

(අ) (1) වන උපවගන්තිය යටතේ වන දැන්වීම නිකුත් කරනු ලබන්නේ කවර අන්තර්ජාල අතරමැදියකු සම්බන්ධයෙන් ද ඒ අන්තර්ජාල අතරමැදියා සමග ඒ මාර්ගගත ගිණුම හෝ ගිණුම් සාදා තිබිය යුතු ය;

(ආ) නිශ්චිතව දක්වනු ලබන මාර්ගගත ගිණුම භාවිත කරමින් ශ්‍රී ලංකාව තුළ අසත්‍ය ප්‍රකාශයක් සන්නිවේදනය කර තිබීම හෝ නිශ්චිතව දක්වනු ලබන මාර්ගගත ගිණුම භාවිත කරමින් ශ්‍රී ලංකාව තුළ සමායෝජිත ව්‍යාජ හැසිරීම් සිදුකර තිබීම; සහ

(ඇ) ඒ මාර්ගගත ගිණුම ව්‍යාජ මාර්ගගත ගිණුමක් බවට හෝ බොට් මගින් පාලනය කරනු ලබන්නක් බවට කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබ තිබීම.

(3) ඒ දැන්වීම, පුද්ගලිකව භාරදෙනු ලැබුවහොත් හෝ ඒ අන්තර්ජාල අතරමැදියා අවසන් වරට සිටි බවට සලකනු ලබන ලිපිනයට තැපැල් මාර්ගයෙන් යවනු ලැබුවහොත් හෝ ඉලෙක්ට්‍රොනික මාර්ගයෙන් එම තැනැත්තා වෙත භාරදෙනු ලැබුවහොත් හෝ නඩුවේ ස්වභාවය මත පදනම්ව කොමිෂන් සභාව විසින් සුදුසු යයි සලකනු ලබන වෙනත් යම් ක්‍රමයක් මගින් භාරදෙනු ලැබුවහොත් ඒ දැන්වීම, ඒ අන්තර්ජාල අතරමැදියා වෙත භාරදෙනු ලැබූ බවට සලකනු ලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරනු ලබන දැන්වීමකට අනුකූලව කටයුතු කරනු ලැබ නොමැති අවස්ථාවක දී කොමිෂන් සභාව විසින් මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. මහෙස්ත්‍රාත්වරයා විසින් ඒ ඉල්ලීම සලකා බැලීමෙන් පසු, (1) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් ඉල්ලා සිටිනු ලබන විධානයන් ද ඇතුළත් කොන්දේසි සහිත ආඥාවක් ඒ අන්තර්ජාල අතරමැදියා වෙත නිකුත් කරනු ලැබිය හැකි ය.

(5) (4) වන උපවන්තිය යටතේ කරනු ලබන ආඥාවක් මගින් ඒ ආඥාව-

(අ) නිශ්චිතව සඳහන් නොකරන කාලයක් සඳහා; හෝ

(ආ) මාස තුනක් නොඉක්මවන නිශ්චිතව දක්වනු ලබන කාලසීමාවක් සඳහා,

බලාත්මක වන බව එහි නිශ්චිතව දක්වනු ලැබිය යුතු ය.

(6) ඒ ආඥාව පුද්ගලිකව භාරදෙනු ලැබුවහොත් හෝ ඒ තැනැත්තා අවසන් වරට සිටි බවට සලකනු ලබන ලිපිනයට ලියාපදිංචි තැපැල් මාර්ගයෙන් යවනු ලැබුවහොත් හෝ ඉලෙක්ට්‍රොනික මාර්ගයෙන් ඒ තැනැත්තා වෙත භාරදෙනු ලැබුවහොත් හෝ මේ පනතේ විධිවිධානවලට අනුකූලව සහ නඩුවේ ස්වභාවය මත පදනම්ව මහෙස්ත්‍රාත්වරයා විසින් සුදුසු යයි සලකනු ලබන වෙනත් යම් ක්‍රමයක් මගින් භාර දෙනු ලැබුවහොත්, (4) වන උපවගන්තිය යටතේ කරනු ලබන ආඥාවක්, ඒ ආඥාව කරනු ලබන්නේ කවර අන්තර්ජාල අතරමැදියකුට විරුද්ධව ද ඒ අන්තර්ජාල අතරමැදියා වෙත භාර දෙනු ලැබූ බවට සලකනු ලැබිය යුතු ය.

(7) (4) වන උපවගන්තිය යටතේ කොන්දේසි සහිත ආඥාවක් කරනු ලබන්නේ කවර අන්තර්ජාල අතරමැදියකුට විරුද්ධව ද, ඒ අන්තර්ජාල අතරමැදියා විසින්, ඒ ආඥාවට අනුකූලව කටයුතු කිරීම හෝ ඒ ආඥාව නියත කරනු නොලැබිය යුත්තේ මන්ද යන්න සම්බන්ධයෙන් හේතු දැක්වීම සඳහා (8) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති පරිදි මහෙස්ත්‍රාත්වරයා ඉදිරියෙහි පෙනී සිටීම හෝ කරනු ලැබිය යුතු ය.

(8) (4) වන උපවගන්තිය යටතේ කොන්දේසි සහිත ආඥාවක් කරනු ලබන්නේ කවර අන්තර්ජාල අතරමැදියකුට විරුද්ධව ද, ඒ අන්තර්ජාල අතරමැදියා විසින් හේතු දැක්වීමට අදහස් කරනු ලබන අවස්ථාවක දී, ඒ අන්තර්ජාල අතරමැදියා විසින්, ඒ ආඥාව කරනු ලබන දින සිට සති දෙකක කාලසීමාවක් ඇතුළත, ඒ ආඥාව කරනු ලබන මහෙස්ත්‍රාත්වරයා ඉදිරියෙහි පෙනී සිට මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති ආකාරයට අනුව ඒ ආඥාව ඉවත් කරන ලෙස හෝ වෙනස් කරන ලෙස හෝ ඉල්ලා සිටිනු ලැබිය යුතු ය:

එසේ වුව ද, (4) වන උපවගන්තිය යටතේ ආඥාවක් කරනු ලබන්නේ කවර අන්තර්ජාල අතරමැදියකුට විරුද්ධව ද ඒ අන්තර්ජාල අතරමැදියා විසින්, මේ වගන්තියේ විධිවිධාන ප්‍රකාර මහෙස්ත්‍රාත්වරයා විසින්, ඒ ආඥාව ඉවත් කරනු ලබන හෝ වෙනස් කරනු ලබන තෙක්, ඒ ආඥාව කරනු ලබන දින සිට බලාත්මක වන පරිදි, ඒ ආඥාවට අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටින්නේ ය.

(9) (4) වන උපවගන්තිය යටතේ ආඥාවක් කරනු ලබන්නේ කවර අන්තර්ජාල අතරමැදියකුට විරුද්ධව ද, ඒ අන්තර්ජාල අතරමැදියා විසින්, ඒ ආඥාවට අනුකූලව කටයුතු කිරීම හෝ (8) වන උපවගන්තිය යටතේ මහෙස්ත්‍රාත්වරයා ඉදිරියෙහි පෙනී සිටීම හෝ සිදු කරනු නොලැබුවහොත්, ඔහු (11) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති දණ්ඩනයට යටත් විය යුතු අතර, ඒ ආඥාව නියත කරනු ලැබිය යුතු ය.

(10) (අ) පෙත්සමක් සහ දිවුරුම් ප්‍රකාශයක් මගින් හේතු දැක්වීම සඳහා, ඒ අන්තර්ජාල අතරමැදියා (8) වන උපවගන්තිය ප්‍රකාරව මහෙස්ත්‍රාත්වරයා ඉදිරියෙහි පෙනී සිටින අවස්ථාවක දී, මහෙස්ත්‍රාත්වරයා විසින් පරීක්ෂණයක් පවත්වනු ලැබිය යුතු අතර, ඒ පරීක්ෂණය, එය ආරම්භ කරනු ලබන දින සිට සති දෙකක් ඇතුළත අවසන් කරනු ලැබිය යුතු ය.

(ආ) මහෙස්ත්‍රාත්වරයා විසින්, (4) වන උපවගන්තිය යටතේ කොන්දේසි සහිත ආඥාවක් කරන ලද්දේ කවර අන්තර්ජාල අතරමැදියකුට විරුද්ධව ද, ඒ අන්තර්ජාල අතරමැදියා විසින් ප්‍රකාශ කරනු ලබන කරුණු සැලකිල්ලට ගනිමින්, මේ වගන්තිය යටතේ වන ආඥාව සාධාරණ නොවන බවට සහ සුදුසු නොවන බවට සෑහීමට පත්වුවහොත්, ඒ ආඥාව ඉවත් කිරීම හෝ වෙනස් කිරීම හෝ මේ පනතේ විධිවිධානවලට යටත්ව උචිත ආඥාවක් කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

(ඇ) මහෙස්ත්‍රාත්වරයා එසේ සෑහීමට පත් නොවුවහොත්, (4) වන උපවගන්තිය යටතේ කරන ලද ආඥාව නියත කරනු ලැබිය යුතු ය.

(ඈ) (4) වන උපවගන්තිය යටතේ කරන ලද ආඥාවක්, (ආ) ඡේදය යටතේ වෙනස් කරනු ලබන අවස්ථාවක දී, ඒ ආඥාව නියත කරනු ලැබිය යුතු ය.

(11) මේ වගන්තිය යටතේ ආඥාවක් කරන ලද්දේ කවර අන්තර්ජාල අතරමැදියකුට විරුද්ධව ද, ඒ අන්තර්ජාල අතරමැදියා, මහෙස්ත්‍රාත්වරයා විසින් ආඥාවෙහි සඳහන් කරනු ලබන කාලසීමාවක් ඇතුළත සහ ආඥාවෙහි සඳහන් කරනු ලබන ආකාරයකට අනුව ඒ ආඥාවට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වන අවස්ථාවක දී, ඒ තැනැත්තා වරදක් සිදු කරනු

ලබන අතර, වරදකරු කරනු ලැබූ විට, වසර හතක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් මිලියන දහයක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයා විසින්, වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, ශ්‍රී ලංකාව තුළ තහනම් ප්‍රකාශය වෙත ප්‍රවේශ වීම වළක්වාලීම මගින් ඒ ආඥාව බලාත්මක කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලෙස කොමිෂන් සභාවට විධාන කරමින් ආඥාවක් කරනු ලැබිය හැකි ය.

## VII වන කොටස

## විමර්ශනවලට සහාය වීම සඳහා විශේෂඥයින් පත් කිරීම සහ ඔවුන්ගේ බලතල

**33.** (1) අමාත්‍යවරයා විසින්, අධිකරණ විෂයය පවරා ඇති අමාත්‍යවරයා විමසා, ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින්, මේ පනත යටතේ වූ වරදක් විමර්ශනය කිරීමේ දී කොමිෂන් සභාවට සහාය වීම සඳහා, (මෙහි මින් මතු "විශේෂඥයා" යනුවෙන් සඳහන් කරනු ලබන) ඉලෙක්ට්‍රොනික් ඉංජිනේරු ශිල්පය හෝ මෘදුකාංග තාක්ෂණය පිළිබඳව නියම කරන ලද සුදුසුකම් සහ පළපුරුද්ද සහිත, රජයේ නිලධරයකු හෝ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක, රාජ්‍ය සංස්ථාවක හෝ ආණ්ඩුවේ සමාගමක සේවා නියුක්තයකු පත් කරනු ලැබිය හැකි ය. විමර්ශනවලට සහාය වීම සඳහා විශේෂඥයන් පත් කිරීම

(2) මේ වගන්තියේ කාර්ය සඳහා-

"විශේෂඥයා" යන්නට-

(අ) නියම කරන ලද සුදුසුකම් සහිත සහ අදාළ විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා විසින් නම් කරනු ලබන, යම් විශ්වවිද්‍යාලයක කාර්ය මණ්ඩලයේ යම් සාමාජිකයකු;

(ආ) අදාළ විශ්වවිද්‍යාලයේ මතය අනුව නියම කරන ලද සුදුසුකම් සහිත සහ එකී විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා විසින් නම් කරනු ලබන යම් රාජ්‍ය ආයතනයක්,

ඇතුළත් වේ:

එසේ වුවද, ඉහත (අ) ඡේදය හෝ (ආ) ඡේදය ප්‍රකාරව ‘‘විශේෂඥයකු’’ හඳුනාගත නොහැකි වන අවස්ථාවක දී, අමාත්‍යවරයා විසින්, අදාළ විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා විමසා, නියම කරන ලද සුදුසුකම් සපුරාලන වෙනත් යම් ආයතනයක් පත් කරනු ලැබිය හැකි ය;

‘‘ආණ්ඩුවේ සමාගම’’ යන්නෙන්, ආණ්ඩුව හෝ රාජ්‍ය සංස්ථාවක් හෝ පළාත් පාලන ආයතනයක් විසින් ඒ සමාගමේ කොටස්වලින් සියයට පනහක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් දරන්නා වූ, 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති හෝ ලියාපදිංචි වී ඇති ලෙස සලකනු ලබන සමාගමක් අදහස් වේ;

‘‘විශ්වවිද්‍යාලය’’ යන්නෙන්, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවන ලද යම් විශ්වවිද්‍යාලයක් අදහස් වේ.

(3) (විශේෂඥතාව ඇති නිශ්චිත ක්ෂේත්‍රයන් සැලකිල්ලට ගෙන) (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද නිලධරයකු විසින් සපුරාලනු ලැබීමට නියම කරන ලද සුදුසුකම් සහ පළපුරුද්ද සහ ඔවුන් පත් කිරීමේ ආකාරය සහ ක්‍රමවේදය සහ ඒ නිලධරයා පත් කිරීමේ කොන්දේසි නියම කරනු ලබන පරිදි විය යුතු ය.

(4) මේ පනත යටතේ වන විමර්ශනයක කාර්යය සඳහා, කොමිෂන් සභාවට සහාය වීමට කැඳවනු ලබන විශේෂඥයකුට-

(අ) උපපොලිස් පරික්ෂකවරයකුගේ නිලයට නොඅඩු නිලයක පොලිස් නිලධරයකු සමඟ යම් පරිශ්‍රයකට ඇතුළුවීමට;

(ආ) යම් කාර්තව්‍යයක් ඉටු කිරීමට හෝ එවැනි වෙනත් යම් දෙයක් කිරීමට යම් තොරතුරු පද්ධතියකට, පරිගණකයකට හෝ පරිගණක පද්ධතියකට හෝ පරිගණකයක ඇති යම් වැඩසටහනකට, දත්තවලට හෝ තොරතුරුවලට ප්‍රවේශ වීමට;

(ඇ) යම් හුවමාරු වන දත්ත හෙළිදරව් කරන ලෙස යම් තැනැත්තකුට නියම කිරීමට;

(ඈ) යම් තැනැත්තකු වාචිකව ප්‍රශ්න කිරීමට; සහ

(ඉ) මේ පනතේ කාර්ය සඳහා, සාධාරණ ලෙස අවශ්‍ය විය හැකි වෙනත් යම් දේ කිරීමට,

බලය තිබිය යුතු ය.

(5) මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයා විමසා, අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි පාරිශ්‍රමිකයන් විශේෂඥයකු වෙත ගෙවනු ලැබිය යුතු ය.

(6) මේ පනත යටතේ වන වරදක් විමර්ශනය කිරීමේ දී කොමිෂන් සභාවට හෝ යම් පොලිස් නිලධරයකුට සහායවීම සඳහා විශේෂඥයකු කැඳවනු ලැබිය හැකි අතර, එකී විමර්ශනයේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි යම් සියලු සහාය ලබාදීම විශේෂඥයාගේ කාර්යය විය යුතු ය. යම් විමර්ශනයකින් සොයා දැනගත් කරුණුවල ප්‍රතිඵලයක් ලෙස යම් නඩු කටයුත්තක් ආරම්භ වී ඇති අවස්ථාවක දී, එකී විමර්ශනය අතරතුර දී ඔහු විසින් ලබා ගනු ලැබිය හැකි යම් තොරතුරු, දත්ත, ද්‍රව්‍ය හෝ වෙනත් දේ එකී නඩු කටයුත්තේ කාර්ය සඳහා ලබා ගැනීමට සැලැස්වීම එකී විශේෂඥයාගේ කාර්යය විය යුතු ය.

**34.** පොලිස් නිලධරයකුගේ බලය යටතේ, යම් හෙළිදරව් කිරීමක් කරන ලෙස හෝ මේ පනත යටතේ වන වරදක් සම්බන්ධයෙන් වන විමර්ශනයකට සහාය වන ලෙස හෝ යම් විශේෂඥයකු විසින් නියම කරනු ලබන යම් තැනැත්තකු, ඒ නියම කිරීමට අනුකූලව කටයුතු කරනු ලැබිය යුතු ය.

විමර්ශනවලට සහාය වීමේ කාර්ය භාරය

**35.** (1) මේ පනත යටතේ වන වරදක් සම්බන්ධයෙන් වන විමර්ශනයක් සඳහා පොලිස් නිලධරයකුට සහාය වන විශේෂඥයකු විසින්, ඒ පොලිස් නිලධරයා විසින් ඒ කාර්යය සඳහා කරන ලද ඉල්ලීමක් මත, තත් කාර්යය සඳහා මහෙස්ත්‍රාත්වරයකු විසින් නිකුත් කරනු ලබන වරෙන්තුවක බලය යටතේ-

වරෙන්තුවක් මත සෝදිසි කිරීමේ සහ තහනමට ගැනීමේ බලතල

(අ) යම් අන්තර්ජාල සේවා සපයන්නකු සන්තකයේ ඇති, දායකවන්නන් පිළිබඳ තොරතුරු සහ හුවමාරු වන දත්ත ඇතුළු යම් තොරතුරක් ලබා ගැනීම; හෝ

(ආ) දායකවන්නන් පිළිබඳ තොරතුරු සහ හුවමාරු වන දත්ත ඇතුළු යම් රැහැන් හෝ ඉලෙක්ට්‍රොනික සන්නිවේදනයකට, ඒ සන්නිවේදනයේ කවර හෝ අවස්ථාවක දී බාධා කිරීම,

කරනු ලැබිය හැකි ය.

(2) මේ පනත යටතේ වන වරදක් සම්බන්ධයෙන් වන යම් විමර්ශනයක කාර්ය සඳහා, හුවමාරු වන දත්ත ඇතුළු දත්ත සහ තොරතුරු රඳවා තබා ගන්නා ආකාරය සහ බාධා කරන ආකාරය සහ ඒ සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, අමාත්‍යවරයා විසින්, නියෝග මගින් නියම කරනු ලැබිය හැකි ය.

## VIII වන කොටස

## මුදල්

කොමිෂන් සභාවේ අරමුදල

**36.** (1) කොමිෂන් සභාවට එහි ම අරමුදලක් තිබිය යුතු ය.

(2) කොමිෂන් සභාවේ පරිහරණය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කලට සම්මත කරනු ලබන සියලු මුදල් ප්‍රමාණයන් කොමිෂන් සභාවේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ වන ස්වකීය කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී කොමිෂන් සභාව විසින් දරන ලද සියලු වියදම් පියවීමට අවශ්‍ය සියලු මුදල් ප්‍රමාණයන් කොමිෂන් සභාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර එවැනි වෙනත් වියදම්, මේ පනතේ විධිවිධාන ප්‍රකාරව අරමුදලට වැය බරක් විය යුතු ය.

(4) කොමිෂන් සභාව විසින්, කොමිෂන් සභාවේ ලැබීම් සහ වියදම්, වත්කම් සහ බැරකම් සහ අනෙකුත් සියලු ගනුදෙනු සම්බන්ධයෙන් නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

(5) කොමිෂන් සභාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

**37.** රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය සම්බන්ධයෙන් වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන, කොමිෂන් සභාවේ අරමුදලේ ගිණුම් විගණනය සඳහා සහ ඒ සම්බන්ධයෙන් අදාළ කරගනු ලැබිය යුතු ය.

ගිණුම් හා විගණනය

## IX වන කොටස

### සාමාන්‍ය

**38.** (1) මේ පනතේ ප්‍රකාශිතව ම විධිවිධාන සලසා ඇති පරිදි හැර, විමර්ශන, නඩු කටයුතු පැවරීම, වැරදි සම්බන්ධයෙන් වන නඩු විභාග සහ මේ පනත යටතේ එවැනි යම් නඩු විභාගයක දී ප්‍රකාශයට පත් කරනු ලබන නඩු තීන්දු, දණ්ඩන නියම සහ ආඥාවන් සම්බන්ධයෙන් 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ කර ගනු ලැබිය යුතු ය.

අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ විධිවිධාන අදාළ විය යුතු බව

(2) කොමිෂන් සභාව විසින්, මේ පනත යටතේ පවත්වනු ලබන විමර්ශනයක් අතරතුර රැස්කර ගන්නා කරුණු සැලකිල්ලට ගෙන යම් තැනැත්තකු මේ පනතේ විධිවිධාන යටතේ වරදක් සිදු කර ඇති බවට සෑහීමට පත්වන්නේ නම්, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 136 වන වගන්තිය ප්‍රකාර අපරාධ නඩු කටයුතු පැවරීමට පියවර ගනු ලැබිය හැකි ය.

**39.** (1) මේ පනත යටතේ වන සියලු වැරදි අසා විභාග කොට, නිශ්චය කිරීමේ අධිකරණ බලය මහෙස්ත්‍රාත් අධිකරණය සතු විය යුතු ය.

අධිකරණ බලය

(2) (1) වන උපවගන්තියේ කුමක් සඳහන් වුව ද, වරදක් සිදු කිරීම සම්බන්ධයෙන් බරපතළ අවස්ථානුගත කරුණු හෝ මහජන කැළඹීමක් ඇති විය හැකි ආකාරයේ අවස්ථානුගත කරුණු පවතින අවස්ථාවක දී, නීතිපතිවරයා විසින් මහාධිකරණය වෙත සෘජුව ම අධිචෝදනා පත්‍රයක් යැවීම නීත්‍යානුකූල විය යුතු ය.

**40.** මේ පනත යටතේ වන වරදක් සිදු කිරීමට තැත් කරන හෝ එවැනි වරදක් සිදු කිරීමට කටයුතු සලස්වන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර, වරදකරු කරනු ලැබූ විට ඒ එක් එක් වරද

වරදක් සිදු කිරීමට තැත් කිරීම

සම්බන්ධයෙන් විධිවිධාන සලස්වා ඇති උපරිම කාලයෙන් හරි අඩක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ එක් එක් වරද සම්බන්ධයෙන් විධිවිධාන සලස්වා ඇති උපරිම දඩයෙන් හරි අඩක් නොඉක්මවන දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

වරදකට අනුබල දීම

**41.** මේ පනත යටතේ වූ වරදකට අනුබල දෙන තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර, පළමුව සඳහන් වරද සඳහා මේ පනතින් විධිවිධාන සලස්වා ඇති ආකාරයට ම නඩු විභාග කරනු ලැබිය යුතු අතර වරදකරු කරනු ලැබූ විට පළමුව සඳහන් වරද සඳහා මේ පනතින් විධිවිධාන සලස්වා ඇති දඬුවමට ම යටත් විය යුතු ය. මේ උපවගන්තියේ "අනුබල දීම" යන යෙදුමට දණ්ඩ නීති සංග්‍රහයේ 100 වන සහ 101 වන වගන්තිවල දී ඇති අර්ථය ම තිබිය යුතු ය.

වරදක් සිදු කිරීමට කුමන්ත්‍රණය කිරීම

**42.** මේ පනත යටතේ වූ වරදක් සිදු කිරීමට වෙනත් යම් තැනැත්තකු සමඟ කුමන්ත්‍රණය කරන තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර, පළමුව සඳහන් වරද සඳහා මේ පනතින් විධිවිධාන සලස්වා ඇති ආකාරයට ම නඩු විභාග කරනු ලැබිය යුතු අතර, වරදකරු කරනු ලැබූ විට පළමුව සඳහන් වරද සඳහා මේ පනතින් විධිවිධාන සලස්වා ඇති දඬුවමට ම යටත් විය යුතු ය. මේ උපවගන්තියේ "කුමන්ත්‍රණය කිරීම" යන යෙදුමට දණ්ඩ නීති සංග්‍රහයේ 113අ වන වගන්තියේ දී ඇති අර්ථය ම තිබිය යුතු ය.

මේ පනත යටතේ වූ වැරදි, සංඥෙය නොවන සහ ඇප දිය හැකි වැරදි බව

**43.** මේ පනත යටතේ වන සෑම වරදක් ම-

(අ) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා සංඥෙය නොවන වරදක්; සහ

(ආ) 1997 අංක 30 දරන ඇප පනතේ අර්ථානුකූලව ඇප දිය හැකි වරදක්,

විය යුතු ය.

පුද්ගල මණ්ඩලයක් විසින් සිදු කරනු ලබන වැරදි

**44.** මේ පනත යටතේ වූ වරදක් පුද්ගල මණ්ඩලයක් විසින් සිදු කරනු ලබන අවස්ථාවක දී, ඒ පුද්ගල මණ්ඩලය-

(අ) සංස්ථාගත මණ්ඩලයක් වන විට, ඒ සංස්ථාගත මණ්ඩලයේ සෑම අධ්‍යක්ෂවරයකු විසින් ම හෝ වෙනත් ප්‍රධාන නිලධරයකු විසින් ම;

(ආ) හවුල් ව්‍යාපාරයක් වන විට, ඒ හවුල් ව්‍යාපාරයේ සෑම හවුල්කරුවකු විසින් ම; සහ

(ඇ) සංස්ථාගත නොකරන ලද මණ්ඩලයක් වන විට, ඒ මණ්ඩලයේ පාලක සාමාජිකයකු වන සෑම පුද්ගලයකු විසින් ම සහ ඒ පුද්ගල මණ්ඩලයේ කළමනාකරණය සහ පාලනය සඳහා වගකිවයුතු ඒ පුද්ගල මණ්ඩලයේ සෑම ප්‍රධාන නිලධරයකු විසින් ම,

වරදක් සිදු කරනු ලබයි:

එසේ වුව ද, ඒ වරද ඔහුගේ අනුදැනුමකින් තොරව සිදු කරනු ලැබූ බව හෝ ඒ වරද සිදු කිරීම වැළැක්වීමට අවශ්‍ය නිසි උද්‍යෝගයෙන් ක්‍රියා කරන ලද බව ඔහු විසින් ඔප්පු කරනු ලබන්නේ නම්, එවැනි කිසිදු තැනැත්තකු වරදක් සිදු කරන ලද බවට සලකනු නොලැබිය යුතු ය.

නඩු කටයුතුවලින් ආරක්ෂාව

**45.**(1) (අ) මේ පනත යටතේ කොමිෂන් සභාව විසින් සද්භාවයෙන් කරන ලද හෝ නොකර හරින ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් කොමිෂන් සභාවට විරුද්ධව; හෝ

(ආ) මේ පනත හෝ වෙනත් යම් පනතක් යටතේ, කොමිෂන් සභාවේ යම් සාමාජිකයකු, කාර්ය මණ්ඩලය හෝ 33 වන වගන්තිය යටතේ පත් කරන ලද විශේෂඥයකු විසින් සද්භාවයෙන් කරන ලද හෝ නොකර හරින ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් එකී තැනැත්තකුට විරුද්ධව,

කිසිදු සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක් පවත්වාගෙන යනු නොලැබිය යුතු ය.

(2) යම් අධිකරණයක් ඉදිරියේ දී කොමිෂන් සභාව විසින් හෝ කොමිෂන් සභාවට විරුද්ධව ගෙන එන ලද යම් සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක දී, කොමිෂන් සභාව විසින් දරන ලද වියදම්, කොමිෂන් සභාවේ අරමුදලින් ගෙවිය යුතු අතර, එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක දී කොමිෂන් සභාව වෙත ගෙවන ලද හෝ කොමිෂන් සභාව විසින් අයකර ගන්නා ලද යම් නඩු ගාස්තුවක් කොමිෂන් සභාවේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ හෝ කොමිෂන් සභාවේ විධානය මත, කොමිෂන් සභාවේ යම් සාමාජිකයකු විසින් හෝ කාර්ය මණ්ඩලය විසින් හෝ කොමිෂන් සභාවට සහාය වන විශේෂඥයකු විසින් කරන ලද හෝ කරන ලදැයි අදහස් කරනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක දී, ඒ තැනැත්තාට විරුද්ධව ගෙන එන ලද යම් සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක දී, ඒ තැනැත්තා විසින් දරන ලද යම් වියදම්, ඒ තැනැත්තා විසින්, ඒ ක්‍රියාව සිදු කරනු ලැබුවේ සද්භාවයෙන් වන බවට ඒ අධිකරණය විසින් තීරණය කරනු ලබන්නේ නම්, ඒ සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තේ දී ඒ තැනැත්තා විසින් ඒ වියදම් අයකර ගනු ලබන්නේ නම් මිස, කොමිෂන් සභාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තා

**46.** (1) කොමිෂන් සභාව විසින්, එක් එක් මුදල් වර්ෂය අවසානයේ සිට මාස තුනක් ඇතුළත, ඒ වර්ෂය තුළ දී සිදු කරන ලද කොමිෂන් සභාවේ ක්‍රියාකාරකම් සහ එළඹෙන වර්ෂයේ දී කොමිෂන් සභාව විසින් සිදු කිරීමට යෝජිත ක්‍රියාකාරකම් පිළිබඳ වාර්තාවක් පිළියෙල කර, ඒ වර්ෂය සඳහා වූ කොමිෂන් සභාවේ විගණනය කරන ලද ගිණුම්වල පිටපතක් ද සමඟ ඒ වාර්තාවේ පිටපතක් අමාත්‍යවරයා වෙත යවනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පිළියෙල කරන ලද වාර්තාවක් ලැබුණු පසු, අමාත්‍යවරයා විසින්, -

(අ) ඒ වාර්තාවේ පිටපතක් පාර්ලිමේන්තුව ඉදිරියෙන් තැබීමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය;

(ආ) ඒ වාර්තාවෙන් පැන නගින යම් කරුණක් සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට හෝ පාර්ලිමේන්තුවේ කාරක සභාවකට පැහැදිලි කරන ලෙස කොමිෂන් සභාවේ සාමාජිකයන්ට නියම කරනු ලැබිය හැකි ය; සහ

(ඇ) ඒ වාර්තාව සහ ගිණුම් සම්බන්ධයෙන් මහජනයාගේ අවධානයට යොමු කරවීම පිණිස, කොමිෂන් සභාව විසින් උචිත යයි සලකනු ලබන යම් ආකාරයකට ඒ වාර්තා සහ ගිණුම් පළ කරන ලෙස කොමිෂන් සභාවට නියම කරනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තියේ පැවැත්මට අගතියක් නොමැතිව, සෑම වාර්ෂික වාර්තාවක ම-

(අ) කොමිෂන් සභාවේ කර්තව්‍යයේ විෂය පථය යටතට අයත් වන්නා වූ ද විශේෂයෙන් මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය සහතික කිරීම සඳහා අදාළ වන්නා වූ ද කරුණු සම්බන්ධයෙන්, ඒ වාර්තාව අදාළ වන්නේ කවර වර්ෂයක් සඳහා ද ඒ වර්ෂය තුළ සිදු කරන ලද වැඩිදියුණු කිරීම් පිළිබඳව වන සාමාන්‍ය සමීක්ෂණයක්; සහ

(ආ) ඒ වර්ෂය තුළ මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය සහතික කිරීම සඳහා කොමිෂන් සභාව විසින් ගන්නා ලද පියවර පිළිබඳ විස්තර,

අන්තර්ගත විය යුතු ය.

**47.** කොමිෂන් සභාවේ සියලු සාමාජිකයන් සහ කාර්ය මණ්ඩලය දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

කොමිෂන් සභාවේ සාමාජිකයන් සහ කාර්ය මණ්ඩලය රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු බව

**48.** කොමිෂන් සභාව, 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගත යුතු ය.

දූෂණ විරෝධී පනතේ කාර්යය සඳහා කොමිෂන් සභාව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු බව

කොමිෂන් සභාව විසින් රීති සාදනු ලැබිය යුතු බව

**49.** (1) කොමිෂන් සභාව විසින්, පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් රීති සාදනු ලැබිය යුතු ය:-

(අ) අන්තර්ජාලය මත පදනම් වූ සන්නිවේදන සේවා සපයන අන්තර්ජාල සේවා සපයන්නන් සහ අන්තර්ජාල අතරමැදියන් සඳහා, ඔවුන් විසින් අනුගමනය කළ යුතු ආරක්ෂක පිළිවෙත් සහ කාර්යපටිපාටිය නිශ්චිතව දක්වමින් චර්යා සංග්‍රහයක් නිකුත් කිරීම සඳහා; සහ

(ආ) ශ්‍රී ලංකාව තුළ අවසාන පරිශීලකයන් හට සමාජ මාධ්‍ය වේදිකා සපයනු ලබන වෙබ් අඩවි, මේ පනත යටතේ ලියාපදිංචි කළ යුතු ආකාරය නිශ්චිතව දැක්වීම සඳහා.

(2) කොමිෂන් සභාව විසින්, (1) වන උපවගන්තිය යටතේ පළමු වරට සාදනු ලබන රීති, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට මාස විසි හතරක් ඇතුළත සාදනු ලැබිය යුතු ය.

(3) කොමිෂන් සභාව විසින්, (1) වන උපවගන්තිය යටතේ රීති සෑදීමට පෙර, සති දෙකකට නොඅඩු කාලයක් සඳහා මහජන අදහස් විමසීමක් කරනු ලැබිය යුතු ය.

(4) (3) වන උපවගන්තියේ සඳහන් මහජන අදහස් විමසීමේ කාලසීමාව, කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි වැඩිදුර කාලසීමාවක් සඳහා දීර්ඝ කරනු ලැබිය හැකි ය.

(5) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම රීතියක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලබන දිනයේ හෝ එහි නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් පසු දිනයක සිට හෝ ක්‍රියාත්මක විය යුතු ය.

(6) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම රීතියක් ම එය ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දින සිට මාස තුනක් ඇතුළත අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් රීතියක්, ඒ යටතේ කලින් කරන ලද කිසිවකට අගතියක් නොමැතිව, ඒ අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

නියෝග

**50.** (1) නියම කරනු ලැබිය යුතු යයි මේ පනතින් නියමිත සියලු කාරණා සම්බන්ධයෙන් හෝ මේ පනත යටතේ නියෝග සෑදීමට

නියමිත හෝ බලය දෙන ලද සියලු කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලබන දින සිට හෝ එහි නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් පසු දිනක සිට ක්‍රියාත්මක විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම නියෝගයක් ම, එය ගැසට් පත්‍රයේ පළ කරන ලද දින සිට මාස තුනක් ඇතුළත අනුමතය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ සෑම නියෝගයක් ම, ඒ යටතේ කලින් කරන ලද කිසිවකට අගතියක් නොමැතිව, ඒ අනනුමතයේ දින සිට පරිච්ඡින්න වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

මේ පනත වෙනත් ලිඛිත නීති අභිබවා බලාත්මක විය යුතු බව

**51.** මේ පනතේ විධිවිධාන සහ වෙනත් ලිඛිත නීතියක් අතර අනනුකූලතාවයක් හෝ ගැටීමක් ඇති වුවහොත්, එවිට, මේ පනතේ විධිවිධාන බලපැවැත්විය යුතු ය.

අර්ථ නිරූපනය

**52.** (1) පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ-

"බොට්" යන්නෙන්, ස්වයංක්‍රීය කටයුතු ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා සාදන ලද හෝ වෙනස් කරන ලද පරිගණක වැඩසටහනක් අදහස් වේ;

"සභාපතිවරයා" යන්නට, 8 වන වගන්තියේ (6) වන උපවගන්තිය යටතේ පත් කරන ලද නියෝජ්‍ය සභාපතිවරයා ද ඇතුළත් වේ;

"ළමයා'' යන්නෙන්, වයස අවුරුදු දහඅටට අඩු තැනැත්තකු අදහස් වේ;

"සමායෝජිත ව්‍යාජ හැසිරීම" යන්නෙන්, යම් කරුණක් සම්බන්ධයෙන් යම් අන්තර්ජාල අතරමැදි සේවාවක ශ්‍රී ලංකාව තුළ සිටින අවසාන පරිශීලකයන් නොමඟ යැවීම පිණිස, මාර්ගගත ගිණුම් දෙකක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් භාවිත කරමින් සිදු කරනු ලබන යම් සමායෝජිත ක්‍රියාවක් අදහස් වන නමුත්, ඊට-

(අ) එක ම තැනැත්තා විසින් පාලනය කරනු ලබන; සහ

(ආ) ව්‍යාජ මාර්ගගත ගිණුමක් නොවන හෝ බොට් මගින් පාලනය නොවන,

මාර්ගගත ගිණුම් භාවිත කරමින් සිදු කරනු ලබන යම් ක්‍රියාවක් ඇතුළත් නොවේ;

"සන්නිවේදනය කිරීම" යන්නෙන්, අන්තර්ජාලය තුළ හෝ අන්තර්ජාලය මගින් ශ්‍රී ලංකාව තුළ සිටින එක් අවසාන පරිශීලකයකුට හෝ ඊට වැඩි සංඛ්‍යාවකට අසත්‍ය ප්‍රකාශයක් හෝ පෞද්ගලික තොරතුරක් සන්නිවේදනය කිරීම අදහස් වන අතර, ඊට සම්ප්‍රේෂණය කිරීම, බෙදා හැරීම, හුවමාරු කර ගැනීම, ජනනය කිරීම, ප්‍රචාරය කිරීම, පළ කිරීම හෝ ඇදීම ඇතුළත් වන අතර "සන්නිවේදනය" යන යෙදුම ඒ අනුව තේරුම් ගත යුතු ය;

"පරිගණකය" යන්නෙන්, තොරතුරු සැකසීමේ හැකියාව දරන ඉලෙක්ට්‍රොනික හෝ සමාන උපක්‍රමයක් අදහස් වේ;

"පරිගණක පද්ධතිය" යන්නෙන්, පරිගණකයක් හෝ අන්තර්ජාලය ඇතුළුව අන්තර් සම්බන්ධිත පරිගණක සමූහයක් අදහස් වේ;

"ප්‍රකාශයට පත් කරන ලද මාර්ගගත ස්ථානය" යන්නෙන්, 28 වන වගන්තිය යටතේ ප්‍රකාශයට පත් කරන ලද මාර්ගගත ස්ථානයක් අදහස් වේ;

''අසත්‍ය ප්‍රකාශය'' යන්නෙන්, යම් ප්‍රකාශයක්, එය වැරදි බව හෝ අසත්‍ය බව එය සිදු කරන්නා දන්නා වූ ද නැතහොත් ඒ බවට විශ්වාස කරන්නා වූ ද විශේෂයෙන් ම රැවටීමේ හෝ නොමග යැවීමේ චේතනාවෙන් සිදු කරන්නා වූ ද ප්‍රකාශයක් අදහස් වන නමුත් ඊට සද්භාවයෙන් කරන ලද අනතුරු ඇඟවීමක්, සද්භාවයෙන් පළ කරන ලද මතයක් හෝ සද්භාවයෙන් කරන ලද අධ්‍යාරෝපණයක් ඇතුළත් නොවේ;

"ව්‍යාජ මාර්ගගත ගිණුම" යන්නෙන්, (යම් මාර්ගගත ගිණුමක පරිශීලකයා, ඊට අනන්‍ය වූ හඳුනා ගැනීමේ නාමය හෝ වෙනත් තොරතුරක් මගින්) ඒ මාර්ගගත ගිණුමේ හිමිකම දරන්නා වශයෙන් පෙනී සිටින තැනැත්තා නොවන වෙනත් යම් තැනැත්තකු විසින් පාලනය කරනු ලබන්නා වූ ද ඒ මාර්ගගත ගිණුමේ හිමිකම දරන්නාගේ අනන්‍යතාව සම්බන්ධයෙන් යම් අන්තර්ජාල අතරමැදි සේවාවක ශ්‍රී ලංකාව තුළ සිටින අවසාන පරිශීලකයන් නොමග යැවීමේ කාර්යය සඳහා ඒ පෙනී සිටීම සිදු කරනු ලබන්නා වූ ද යම් මාර්ගගත ගිණුමක් අදහස් වේ;

"අන්තර්ජාල සේවා සපයන්නා" යන්නෙන්, 1991 අංක 25 දරන විදුලි සංදේශ පනත යටතේ විදුලි සංදේශ සේවා සපයන්නන් ද ඇතුළුව, යවනු ලබන හෝ ලබා ගන්නා දෙයෙහි අන්තර්ගතය වෙනස් කිරීමෙන් තොරව, පරිශීලකයා විසින් තෝරාගනු ලබන දේ, පරිශීලකයා විසින් නිශ්චිතව දක්වනු ලබන ස්ථාන අතර හෝ ඒ අන්තරයෙහි සම්ප්‍රේෂණය කිරීම සහ ගමන් කරවීම සිදු කරන හෝ ඩිජිටල් මාර්ගගත සන්නිවේදනය සඳහා සබඳතා සපයන යම් අස්ථිත්වයක් අදහස් වේ;

"අන්තර්ජාල අතරමැදියා" යන්නෙන්, යම් අන්තර්ජාල අතරමැදි සේවාවක් සපයනු ලබන තැනැත්තකු අදහස් වේ;

"අන්තර්ජාල අතරමැදි සේවාව" යන්නෙන්-

(අ) අන්තර්ජාලය තුළ හෝ අන්තර්ජාලය මගින් තුන්වන පාර්ශ්වයන්ගෙන් උත්පාදනය වන දේ සඳහා ප්‍රවේශ වීම පිණිස අවසාන පරිශීලකයන් හට ඉඩ ලබා දෙන සේවාවක්;

(ආ) අන්තර්ජාලය තුළ හෝ අන්තර්ජාලය මගින් අවසාන පරිශීලකයන් හට ඒ දේවල් සම්ප්‍රේෂණය කිරීමේ සේවාවක්;

(ඇ) සෙවුම් ප්‍රතිඵල සූචිය පිහිටි ස්ථානයෙන් වෙන්ව පවතින ස්ථානයක රඳවා තබා ඇති හෝ ගබඩා කර ඇති අන්තර්ගතයන්ට, ඒ එක් එක් සෙවුම් ප්‍රතිඵලය මගින් ඒ අවසාන පරිශීලකයා සම්බන්ධ කරන්නා වූ සෙවුම් ප්‍රතිඵල සූචියක්, මාර්ගගත සෙවුමක් සිදු කිරීම සඳහා එකී සේවාව භාවිත කරන අවසාන පරිශීලකයකුට ප්‍රදර්ශනය කිරීමේ සේවාවක්; හෝ

(ඈ) අන්තර්ජාලය මත පදනම් වූ සේවාවක් මගින් මාර්ගගත ස්ථානවල හිමිකරුවන් හෝ මෙහෙයුම්කරුවන් සහ ප්‍රචාරකයන් සහ සේවා සපයන්නන් අතර වන සබැඳිය හෝ සබැඳියේ කොටසක් ලෙස කටයුතු කිරීමෙන් යම් ස්ථානයක ගෙවීමක් කරනු ලබන අන්තර්ගතයන් සන්නිවේදනය කිරීම සඳහා පහසුකම් සලසන සේවාවක්,

අදහස් වන නමුත්, ඊට මහජනයාට අන්තර්ජාලය වෙත හෝ පරිගණක සම්පත් සේවාවක් වෙත ප්‍රවේශ වීමට ඉඩ ලබා දෙන සේවාවක් සැපයීමේ කාර්යය සඳහා සිදු කරනු ලබන හෝ ඊට ආනුෂංගික යම් ක්‍රියාවක් ඇතුළත් නොවේ;

"දෙය" යන්නෙන්, යම් ප්‍රකාශයකින් සමන්විත වන්නා වූ හෝ යම් ප්‍රකාශයක් අන්තර්ගත වන්නා වූ යමක් අදහස් වේ;

"අමාත්‍යවරයා" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන ව්‍යවස්ථාව හෝ 45 වන ව්‍යවස්ථාව ප්‍රකාර මේ පනතේ විධිවිධාන පරිපාලනය කිරීමේ කර්තව්‍යය පවරා ඇති අමාත්‍යවරයා අදහස් වේ;

"මාර්ගගත ගිණුම" යන්නෙන්, අන්තර්ජාල අතරමැදි සේවාවක් භාවිත කිරීම සඳහා අන්තර්ජාල අතරමැදියකු සමඟ නිර්මාණය කරන ලද ගිණුමක් අදහස් වේ;

"මාර්ගගත ස්ථානය" යන්නෙන්, පරිගණකයක රඳවා තබා ඇත්තා වූ ද, අන්තර්ජාලය මගින් දැකිය හැකි, සවන් දිය හැකි හෝ අන්‍යාකාරයකින් අවබෝධ කරගත හැකි වන්නා වූ ද, වෙබ් අඩවියක්, වෙබ් පිටුවක්, පිළිසඳර මැදිරියක් හෝ සංසදයක් හෝ වෙනත් යම් දෙයක් අදහස් වේ;

"ගෙවීමක් කරනු ලබන අන්තර්ගතය" යන්නෙන්, ප්‍රතිෂ්ඨාවක් ගෙවීම මත යම් ස්ථානයක සන්නිවේදනය කරනු ලබන යම් ප්‍රකාශයක් අදහස් වේ;

"දණ්ඩ නීති සංග්‍රහය" යන්නෙන්, (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහය අදහස් වේ;

"තැනැත්තා" යන්නෙන්, ස්වභාවික හෝ නෛතික තැනැත්තකු අදහස් වේ;

"නියම කිරීම" යන්නෙන්, නියෝග මගින් නියම කිරීම අදහස් වේ;

"තහනම් ප්‍රකාශය" යන්නෙන් 12 වන, 13 වන, 14 වන, 15 වන, 16 වන, 17 වන, 19 වන හෝ 20 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති ප්‍රකාශයක් අදහස් වේ;

"පළ කිරීම" යන්නෙන්, අන්තර්ජාලය මත හෝ හරහා ජනතාව වෙත යමක් ලබා දීම අදහස් වේ;

"සමාජ මාධ්‍ය වේදිකාව" යන්නෙන්-

(අ) ශ්‍රී ලංකාව තුළ සිටින අවසාන පරිශීලකයන් දෙදෙනෙක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් අතර මාර්ගගත සමාජ අන්තර්ක්‍රියා පවත්වාගෙන යාමට හැකියාව ලබාදීමේ එකම කාර්යය සඳහා වන;

(ආ) ශ්‍රී ලංකාව තුළ සිටින අවසාන පරිශීලකයන් හට එවැනි අවසාන පරිශීලකයන් කිහිප දෙනෙකු හෝ අනෙකුත් සියලු අවසාන පරිශීලකයන් සමඟ සම්බන්ධ වීමට ඉඩ ලබාදෙන; හෝ

(ඇ) ශ්‍රී ලංකාව තුළ සිටින අවසාන පරිශීලකයන් හට යම් සේවාවක් තුළ යම් දෙයක් පළ කිරීමට ඉඩ ලබා දෙන,

අන්තර්ජාල අතරමැදියෙකු විසින් සපයන සේවාවක් අදහස් වන නමුත් ඊට ශ්‍රී ලංකාව තුළ සිටින අවසාන පරිශීලකයන් හට ඒ සේවාව මගින් සන්නිවේදනය කරන ලද යම් තොරතුරක් වෙත ප්‍රවේශ වීමට හැකියාවක් නොමැති සේවාවක් ඇතුළත් නොවේ;

"ප්‍රකාශය" යන්නෙන්, කෙටි යෙදුමක් සහ මුලකුරක් ද ඇතුළුව යම් වචනයක්, ඉලක්කමක්, (චලනය වන හෝ අන්‍යාකාරයක් වන) රූපයක්, ශබ්දයක්, සංකේතයක් හෝ වෙනත් නිරූපණයක් හෝ මේ කිසිවක සංකලනයක් අදහස් වේ.

(2) මේ පනතේ භාවිත කරනු ලැබ අර්ථ දක්වනු නොලැබූ නමුත් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථ දක්වා ඇති, යම් වචනයකට හෝ යෙදුමකට දණ්ඩ නීති සංග්‍රහයේ ඒ වචනයට හෝ යෙදුමට දී ඇති අර්ථය ම ඇත්තේ ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**53.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

## උපලේඛනය

(21 (1) වගන්තිය)

| දණ්ඩ නීති සංග්‍රහයේ වගන්තිය | දණ්ඩ නීති සංග්‍රහය යටතේ වරද | දඬුවම |
|---|---|---|
| 286අ | ළමයින්ට අදාළව කරනු ලබන අසභ්‍ය පළකිරීම්, ප්‍රදර්ශන ආදිය. | අවුරුදු දෙකකට නොඅඩු වූ ද අවුරුදු දහයක් නොඉක්මවන්නා වූ ද කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු අතර දඩයකින් දඬුවම් කරනු ලැබිය හැකි ය. |
| 288 | ළමයින්ට සිඟාකෑමට සැලැස්වීම හෝ කුට්ටනය කිරීම | අවුරුදු පහකට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කරනු ලැබිය යුතු අතර දඩයකට ද යටත් විය යුතු ය. |
| 288අ | ලිංගික සංසර්ගය සඳහා කුට්ටානියකු වශයෙන් ක්‍රියා කිරීමට ළමයින් කුලියට ගැනීම හෝ සේවයේ යෙදවීම | අවුරුදු දෙකකට නොඅඩු සහ අවුරුදු පහකට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කරනු ලැබිය යුතු අතර දඩයකට ද යටත් විය යුතු ය. |
| 288ආ | සීමිත භාණ්ඩ ජාවාරම් කිරීමට ළමයින් කුලියට ගැනීම හෝ සේවයෙහි යෙදවීම | අවුරුදු පහකට නොඅඩු සහ අවුරුදු හතකට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කරනු ලැබිය යුතු අතර දඩයකට ද යටත් විය යුතු ය. |
| 308අ | ළමයින් කෲරත්වයට භාජනය කිරීම | අවුරුදු දෙකකට නොඅඩු වූ ද අවුරුදු දහයක් නොඉක්මවන්නා වූ ද කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කරනු ලැබිය යුතු අතර දඩයකින් ද දඬුවම් කරනු ලැබිය හැකි ය. තව ද, ඒ ඒ වරද සිදුකරන ලද්දේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද, ඒ තැනැත්තාට සිදුකරන ලද හානි වෙනුවෙන් අධිකරණය විසින් නිශ්චය කරනු ලබන මුදලක වන්දියක් ඒ තැනැත්තාට ගෙවන ලෙස ද අධිකරණය විසින් ආඥා කරනු ලැබිය හැකි ය. |

| | | |
|---|---|---|
| 360අ | කුට්ටනය | අවුරුදු දෙකකට නොඅඩු වූ ද අවුරුදු දහයක් නොඉක්මවන්නා වූ ද කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කරනු ලැබිය යුතු අතර දඩයකින් ද දඬුවම් කරනු ලැබිය හැකි ය. |
| 360ආ | ළමයින්ගෙන් අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීම | අවුරුදු පහකට නොඅඩු වූ ද අවුරුදු විස්සක් නොඉක්මවන්නා වූ ද කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කරනු ලැබිය යුතු අතර දඩයකින් ද දඬුවම් කරනු ලැබිය හැකි ය. |
| 360ඇ | තැනැත්තන් වෙළඳාම් කිරීම | අවුරුදු තුනකට නොඅඩු සහ අවුරුදු විස්සක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කරනු ලැබිය යුතු අතර දඩයකින් ද දඬුවම් කරනු ලැබිය හැකි ය. |
| 363 | ස්ත්‍රී දූෂණය | අවුරුදු හතකට නොඅඩු වූ ද අවුරුදු විස්සක් නොඉක්මවන්නා වූ ද කාලයකට බරපතල වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කරනු ලැබිය යුතු අතර දඩයකින් සහ ඒ වරද සිදුකරන ලද්දේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ තැනැත්තාට සිදු කරන ලද හානි වෙනුවෙන් අධිකරණය විසින් නිශ්චය කරනු ලබන මුදලක වන්දියක් ඒ තැනැත්තාට ගෙවන ලෙස ද අධිකරණය විසින් ආඥා කරනු ලැබිය යුතු අතර එකී වන්දි මුදල ගෙවීම පැහැර හරිනු ලැබුවහොත් අතිරේකව අවුරුදු දෙකක් දක්වා දීර්ඝ විය හැකි කාලයකට බන්ධනාගාරගත කිරීමකට යටත් විය යුතු ය. |
| | (අ) තමාගේ භාරයේ සිටින ස්ත්‍රියක් රජයේ නිලධරයකු විසින් දූෂණය කිරීම | අවුරුදු දහයකට නොඅඩු වූ ද අවුරුදු විස්සක් නොඉක්මවන්නා වූ ද කාලයකට බරපතල වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කරනු ලැබිය යුතු අතර දඩයකින් සහ ඒ වරද සිදු කරන |

| | | |
|---|---|---|
| | (ආ) රක්ෂණ නිවාසයක හෝ කාන්තා හෝ ළමා ආයතනයක යනාදියක කළමනාකරණ පක්ෂයේ හෝ කාර්ය මණ්ඩලයේ නියුතු තැනැත්තකුව සිටිමින් ඒ නිවාසයේ හෝ ආයතනයේ නේවාසික යම් ස්ත්‍රියක් දූෂණය කිරීම | ලද්දේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ තැනැත්තාට සිදුකරන ලද හානි වෙනුවෙන් අධිකරණය විසින් නිශ්චය කරනු ලබන මුදලක වන්දියක් ඒ තැනැත්තාට ගෙවන ලෙස ද අධිකරණය විසින් ආඥා කරනු ලැබිය යුතු අතර, එකී වන්දි මුදල ගෙවීම පැහැර හරිනු ලැබුවහොත් අතිරේකව අවුරුදු දෙකක් දක්වා දීර්ඝ විය හැකි කාලයකට බන්ධනාගාරගත කිරීමකට යටත් විය යුතු ය. |
| | (ඇ) රෝහලක කළමනාකරණ පක්ෂයේ හෝ කාර්ය මණ්ඩලයේ නියුතු තැනැත්තකුව සිටිමින් ඒ රෝහලේ ස්ත්‍රියක් දූෂණය කිරීම | |
| | (ඈ) ගර්භණී ස්ත්‍රියක් දූෂණය කිරීම | |
| | (ඉ) අවුරුදු දහඅටකට අඩු ස්ත්‍රියක් දූෂණය කිරීම | |
| | (ඊ) මානසික වශයෙන් හෝ ශාරීරික වශයෙන් ආබාධිත ස්ත්‍රියක් දූෂණය කිරීම | |
| | (උ) රංචු ගැසී ස්ත්‍රී දූෂණය කිරීම | |
| | අවුරුදු දහසයකට අඩු ස්ත්‍රියක් දූෂණය කරනු ලැබූ අවස්ථාවක දී ඒ පුරුෂයාට ඒ ස්ත්‍රිය කෙරෙහි 364අ වන වගන්තියේ දක්වා ඇති ඥාති සම්බන්ධතාවලින් කිසිවක් වේ නම් | අවුරුදු පහළොවකට නොඅඩු වූ ද අවුරුදු විස්සක් නොඉක්මවන්නා වූ ද කාලයකට බරපතල වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීමකින් සහ දඩයකින් දඬුවම් කරනු ලැබිය යුතු ය. |
| 364අ | ව්‍යභිචාරය | අවුරුදු හතකට නොඅඩු වූ ද අවුරුදු විස්සක් නොඉක්මවන්නා වූ ද කාලයකට බරපතල වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීමකින් සහ දඩයකින් දඬුවම් කරනු ලැබිය යුතු ය. |
| 365 | අස්වාභාවික වැරදි | අවුරුදු දහයකට නොඅඩු වූ ද අවුරුදු විස්සක් නොඉක්මවන්නා වූ ද කාලයකට බරපතල වැඩ |

| | | |
|---|---|---|
| | | ඇතිව බන්ධනාගාරගත කිරීමකින් සහ දඩයකින් දඬුවම් කරනු ලැබිය යුතු අතර ඒ වරද සිදුකරන ලද්දේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද, ඒ තැනැත්තාට සිදුකරන ලද හානි වෙනුවෙන් අධිකරණය විසින් නිශ්චය කරනු ලබන මුදලක වන්දියක් ඒ තැනැත්තාට ගෙවන ලෙස ද අධිකරණය විසින් ආඥා කරනු ලැබිය යුතු ය. |
| 365අ | තැනැත්තන් අතර දැඩි අශිෂ්ට ක්‍රියා | අවුරුදු දහයකට නොඅඩු වූ ද අවුරුදු විස්සක් නොඉක්මවන්නා වූ ද කාලයකට බරපතල වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීමකින් සහ දඩයකින් දඬුවම් කරනු ලැබිය යුතු අතර ඒ වරද සිදුකරන ලද්දේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද, ඒ තැනැත්තාට සිදුකරන ලද හානි වෙනුවෙන් අධිකරණය විසින් නිශ්චය කරනු ලබන මුදලක වන්දියක් ඒ තැනැත්තාට ගෙවන ලෙස ද අධිකරණය විසින් ආඥා කරනු ලැබිය හැකි ය. |
| 365ආ | බරපතල ලිංගික අපයෝජනය | අවුරුදු හතකට නොඅඩු වූ ද අවුරුදු විස්සක් නොඉක්මවන්නා වූ ද කාලයකට බරපතල වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීමකින් සහ දඩයකින් දඬුවම් කරනු ලැබිය යුතු අතර ඒ වරද සිදුකරන ලද්දේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද, ඒ තැනැත්තාට සිදු කරන ලද හානි වෙනුවෙන් අධිකරණය විසින් නිශ්චය කරනු ලබන මුදලක වන්දියක් ඒ තැනැත්තාට ගෙවන ලෙස ද අධිකරණය විසින් ආඥා කරනු ලැබිය හැකි ය. |

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.